
ASRUS
KINGDOM

HG කාවින්දයා සුභාෂිණී

ඇස්රූස් රාජධානිය

*Kingdom of Azrus*

*HG කාවින්දයා සුභාෂිණී*

**2023/11/20**

**පිදුම ~**

*දැඩි කල සඳ මාපිමාතාවන්*

*නිරතුරු සිහි කරමි*

*ඔපවත් කල සිප් සතරින් මං*

*නමදිමි ගුරු කැළ බැති සිතින්*

*මැදි විදූ වේදි සොයුරු සොයුරි හැම*

*කලන මෙතින් සුසැදි*

*මේ ගත සුරතින් ඒ හැම දෝතට*

*මලක් ලෙසින් පුදමි මේ පොත ....*

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

ඇස්රූස් රාජධානිය යනු සතර මහා රාජදානි වලින් එකකි.මෙම රාජධානිය පාලනය කරනු ලැබුවේ කාන්තාවක් ය ඇය හේයුන් රැජිනයි ඇය ඉතා දක්ෂ සටන් ශිල්පිනියකි.ඇය හැම අතින්ම සුන්දර පරිපූර්ණ කාන්තාවකි.ඇය තවමත් තරුණ වයසේ පසු වූවා ය.

ඒ විතරක් නෙවෙයි ඇස්රූස් කියන්නේ මකරුන් අරක්ගත් රාජධානියක් මකරු විදිහට වෙස් මාරු කර ගැනීමට හැකියාව ඇති නම් ඒ කෙනා මොන තරාතිරමක වුනත් එයාට ලොකු තැනක් හිමි උනා. ඇස්කලස් පෙලපතෙන් පැවත එන රාජ්‍ය උරුමයට සහිත එක්කෙනෙකුට විතරයි මකරෙක් වෙන්නත් පුළුවන් උනේ ඔහුගේ මකරා ඉතා සද්දන්ත මකරෙකි...

මෙම රාජදානි සතර තුල ඉතා හොද සම්බන්ද තාවයක් නම් තිබුනේ නෑ ඔවුන් අතර විශාල බල අරගලයක් පැවතිනි...

ඇස්රූස් රාජධානිය හුග කාලයන් ඇස්කල්ස් වරුන්ගේ හා ඇස්කාඩො වරුන්ගේ යුද්ද වලට යට වෙලයි තිබුනේ...

ඒ වුනත් ඒ අතරින් බරපතල ම දේ උනේ ඇස්රූස් රාජධානිය ඇතුලේ පෙලපත් නාම දෙකක් තිබීම නිසා අභ්‍යන්තර බල අරගල තිබීමයි. ඒ නිසා ඇස්රූස් රාජධානිය ඇතුලෙ රාජද්‍රෝහී කුමන්ත්‍රණ රැජින ඉදිරිපිටම සිදු වුණි.

රැජිනට එවැනි දේට ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වූයේ ඇස්රූස් රාජධානයේ වැඩි බලයක් තිබුනේ ඇස්කලස් වරුන්ට නිසායි. ඇස්කාඩෝ වරු යනු ඇස්රූස් රාජධානියේ සැබෑ හිමි කාරයෝය ඒ නිසා රැජින ඇස්කාඩෝ පෙලපතෙන් පැවත එන නිසා හේයුන් රැජින

රාජ්‍යයේ සැබෑ හිමි කාරයෙකි.හේයුන් රැජිනට රජකම හිමිවූයේ ඇස්කාඩෝ පෙලපතෙන් පැවත ඒමත් ඇයගේ මෑණියන්ට හා පියාණන්ට කුමරුවන් නොසිටීමත් නිසාය...

ඒ වුණත් එක කාලයකදී රාජ්‍ය හිමිකමට තිබුණු බල අරගලය නිසා ඇස්රූස් වලින් පිරිසක් පිටත් කර හැරියේය.ඔවුන්ගෙන් කොටසක් ඇස්රූස් වල ඉතුරු වුනි..ඒ පිරිස උත්සාහ කළේ ඇස්රූස් රාජධානියේ බලය ඒ අයගේ අතට ලබා ගැනීමටය.

ටික කාලයක් යද්දි සැබෑ උරුමක්කාරයෝ ත් ඔවුන්ගේ පැත්තට හැරීම නිසා ඒ අයගේ බලය වැඩි උනේ අන්තිමට රාජ සභාව වගේ උසස් තැන්වල වැඩි බලයක් ඔවුන්ට හිමි කර දීමත් සමගය.එම හේතු නිසා හේයුන් රැජිනට ඇස්රූස් රාජධානිය පාලනය කිරීමට ලොකු අයිතියක් තිබුණේ නැහැ.ඇයව නිකන්ම ඇස්කල්ස් ලාගේ රූකඩයක් බවට පත් වුණා ..

ඒ වුණත් හේයුන් රැජින හිතුවේ රාජ්‍ය හිමිකම ඇතුව කවදා හෝ සැබෑ ඇස්කාඩෝ වරුන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කිරීමටය...

හැබැයි එක පාරටම වුණේ ඇය හිතුවෙවත් නැති දෙයක් ඇස්කල්ස් ලා ඇස්රූස් රාජධානිය වෙනුවෙන් තවත් අලුත් රූකඩ රජෙක් ගෙන ඒමට සැලසුම් කරන බව හේයුන් රැජිනට දැන ගැනීමට හැකි වූයේ අහම්බෙනි.

ඔහු ඇස්කලස් වරුන්ගේ පෙළපත් නාමය හිමි ලී වුන් කුමරුය

“බටහිර ඇස්කලස් වරුන්ගේ පෙලපත් නාමය හිමි ලී වුන් කුමරු බටහිර දොරටුවෙන් නැවත්ත් රාජ්‍යයට ඇතුලු වෙන ලදී...

ඒ කියනවත් එක්කම සද්දන්ත ද්වාරය වැහිලා යද්දි හේයුන් රැජින රාජ්‍යයේ උඩු මහලේ තිබූ සඳලුතලයෙන් බැස විත් එළිමහන් උද්‍යානයට පැමිණියේය..ලී වුන් කුමරු අශ්වයාගේ පිටෙන් බැස විත් රැජිනට ආචාර කලේය...

“මා ඔබට පැවසුයේ මාලිගයේන් එලියේ දකුණු පාලත මුර කරන්න කියලා...හදිසි දැනුම් දීමකින් තොරව ඇයි ඔබ මෙහි පැමිණියේ...?”

හේයුන් රැජින කිසිවක් නොදන්නා ගානට ලී වුන් කුමරුගෙන් විමසුවේ ලී වුන් කුමරුගේ කටින් ම සත්‍ය දැන ගැනීම පිනිසය...

“මන් ඒ පලාතේ මුර සේවයෙන් ඉවත් වුනා ඒ වෙනුවට මට වඩා හොද කෙනෙක් එයට යොදවලයි තිබෙන්නේ “

“කවුරුන්ද ඔබට වඩා හොද?”

“හන් සේයොන් සෙනෙවි තුමා ඔහු හැම අතින්ම මට වඩා දක්ශයෙක්...ඒ ගැන මම ඔබතුමියට පසුව සන්දේශයකින් පැහැදිලි කරන්නම්. දැන් මම විවේක ගැනීමට පිටව ගියාට කමක් නැද්ද.?”

එසේ පවසා ලී වුන් කුමරු පිටව යන විට රැජිනියගේ කෝපය ඇවිස්සී තිබුනේය රැජිනගේ කෝපය පාලනය කරගැනීමට එතනින් පිටව යන විට රැජිනගේ ආරක්ෂකයින් ද පසු පස පැමිණියේ කිසිවක් හෝ පවසා රැජින කෝපය තවත් අවිස්සීමට අවශ්‍ය නොවුණු නිසාය...

ලී වුන් කුමරු මාලිගයට ඇතුලු වී පලමුව ගියේ මින් ආදිපාදිවරයා හමුවීමටය..

මින් ආදිපාදිවරයා යනු ඇස්කලස්ලාගේ නායකයායි ඔහු ලී වුන් කුමරු ගේ මාමා යි. මොහුත් රාජ්‍යයේ සිට රජුට විරුද්දව කැරලි ගසන්නෙකි.

“ඔහ් ඔබ පැමිණියාද ? මා සිතුවේ තව දින දෙකක් වත් ගත වේ යැයි කියා...”

“ඔයා අපේ සැලැස්ම ට අනුව වැඩ කරන්න ඕනේ...”

“ඒ වුනත් රැජින මේ ගැන දන්නෙ නෑ කියලා විශ්වාස ද ?”

“රැජින ?එහෙම කියනවාටත් පාඩුයි. ඇයට කිසිවක් කර ගන්නත් බෑ... ඇය මේ දේවල් ගැන දන්නවා වෙන්නත් බෑ...එයා දැනගත්තා කියලා එයා මොනවා කරන්න ද...? ‘’

“එහෙනම් හෙට රාජ සභාවේ දී හමු වෙමු... මම ගිහින් එන්නම්.”

“යන ගමන් හන් ජොන් ව මුනගැසී යන්න...’’

ලී වුන් කුමරු එය නෑසුනා සේ එතනින් පිටව ගියේය.

හන් ජොන් යනු මින් ආදිපාදිවරයාගේ එකම දියනියයි. ඔහුගේ සැලැස්ම වූයේ ලී වුන් කුමරු රජු කරවා ඇයගේ දියණිය රජු ගේ අග බිසව කර ඇස්රුස් වල රැජිණ කිරීමරයි.

ඒත් අනාගතේ කුමක් සිදුවේදැයි කියා කිසිවෙක් දැන සිටියේ නෑ.

ලී වුන් කුමරු ට හන් ජොන් ගැන ඔහුගේ සිතේ ඒ තරම් පැහැදිලි අදහසක් නොතිබ්බාට හන් ජොන් නම් ඔහුට කැමැත්තෙන් සිටින බව රාජ්‍යයේ සිටින සැමටම නොරහසක් උනා...නමුත් එහෙම කැමැත්තක් ලී වුන් කුමරුගේ තුන් හිතකවත් නොතිබීම ගැන හන් ජොන් නිතරම කණගාටු වුනි.

“මටත් වෙන්නෙ රූකඩ රජෙක් වෙන්න...”

ලී වුන් කුමරු ඔහුට ම සිතෙන් කියා ගත්තත් රූකඩයක් නැත්නම් පඹයෙක් හරි කමක් නෑ රජ වෙන්න තියෙනවා නම් ඔහු ආස කාලා...

හේයුන් රැජින රාජ සභාවේ සිංහාසනය මතට වී බර කල්පනා වක සිටියදී ඇයට ඇහුනා ඔහු පැත්තට එන අඩි සද්දයක් ...

"ඇයි ආවෙ ?"

හේයුන් රැජිනට ආපු කෙනා දිහා බලන්න වත් වෙලාව නාස්ති කරන්න උත්සහ කරන්නෙ නැතුව...

හේයුන් රැජිනට ආවෙ කවුද කියලා බලන්න තරම් උවමනාව ක් තිබ්බෙ නෑ...

"මට ඕන නිසා ''

ඒ කටහඩත් එක්ක හේයුන් රැජින ඔලුව උස්සලා බැලුවා ඒ ඇස් දකිද්දි ඇයට කට කොනින් හිනාවක් ගියා.

"ඔයා මොනවද මෙහි කරන්නේ ?"

"මට මෙහි කොහෙවත් ඇවිදීමට ඔබගෙන් අවසර ඕනෙ නෑ..."

"ඒකත් ඇත්ත තමා ...මන් කියන විදියට නෙවෙයි නේ මීන් ආදිපාදතුමා කියන විදියට නෙ මෙහෙ වැඩ වෙන්නේ..."

හේයුන් රැජින එහෙම කියන ගමන් ඕනාවට එපාවට සිනහා උනේ මීදි ගෙඩියක් කන ගමන්.

"ඇයි ඔයා වැඩේ තවත් අමාරු කරන්නේ...?

පර්වතයෙන් පල්ලෙහාට වැටෙනවා කියලා දැන දැනත් ඇයි මැරුණු දර අත්තක එල්ලුනේ..."

"ඔයා දන්නේ නැති වුණාට මට ඒ දර අත්ත පෙනුනේ ශක්තිමත් නුග ගහක

ශක්තිමත් අත්තක තියෙන වැලක් වගෙයි ...ඒකයි එල්ලුනේ ."

"ඔයා රැජිනක් වෙන්න සුදුසු නෑ ඇයි එක සුදුසු කෙනෙකුට දීලා පැත්තකට වෙන්නෙ නැත්තෙ...?"

“ඇයි මන් සුදුසු නැත්තෙ “

හේයුන් කුමරිය එහෙම ඇහුවේ සිංහාසනයේ තවත් හොඳට වාඩිවෙන ගමන්...

“ඔයා දුර්වලයි රැජිනක ට කවදාවත් රජෙක් වෙන්න බෑ...

ඔයාව මාලිගාවේ කවුරුත් රැජිනක් විදිහට දකින්නෙත් නෑ

ඔබ සුන්දර කාන්තාවක් පමණයි ...”

“මා එතරම් සුන්දරයිද “

හේයුන් රැජින එහෙම අහද්දී ලී වුන් කුමරු උත්තරයක් නොදී බිම බලා ගන්නවා..ලී වුන් කුමරු උත්තරයක් දුන්නෙ නැති නිසා හේයුන් රැජින හයියෙන් සිනා සී තවත් මිදි ගෙඩියක් කටේ දාගන්නවා...ඇයගේ සිනහව රාජ සභාව පුරාම දෝන්කාර දුන්නා. .

“ඔයාගේ තියෙන එකම ප්‍රශ්නේ තමයි රැජිනකට ගරු කරන්න දන්නැති එක...නැත්තං ඔයා ටිකක් එයාලට වඩා වෙනස්”

හේයුන් රැජින එසේ පවසද්දී ලී වුන් කුමරු අත මිටි මොලවගෙන මිරික ගත්තේ හිතට ආපු තරහටයි...

“ඔයා රජ කෙනෙක් නෙවෙයි...ඒ වුනත් මම රජ වුන දවසට මම පෙන්වන්නම් ඒ මොකක්ද කියලා “

ලී වුන් කුමරු එසේ පවසද්දි අතේ තිබුන මිදි භාජනය පැත්තකට විසි කර කුමරු ගාවට පැමිණ කුමරුගේ ඇඳුමෙන් අල්ලාගෙන දණහිසට ගැහුවේ ලී වුන් කුමරු රැජින ඉදිරියේ දන ගැසෙද්දීයි...

“”රැජිනක් ඉස්සරහ හැසිරෙන්න ඕනෙ ඔය විදිහට නෙවෙයි “"

හේයුන් රැජින එසේ පවසද්දී ලී වුන් කුමරුට දැනුනා ඔහුගේ ඇඟේ තිබෙන හැම නහරයක් ම තරහටම ඉදිමෙනවා කියලා...

“මමයි රැජින “

හේයුන් රැජින  ඔහුගේ කණට කොඳුරලා එතැනින් යන්න ගියේ ඔහුගේ උරහිස ටත් තට්ටුවක් දමා ගෙනය. ලී වුන් කුමරු දණ ගසාගෙන සිටි තැනින් නැගිට  සිංහාසනය දෙස බලා සිට එතැනින් පිටව ගියේය ...

“රැජින සෞඛ්‍ය සම්පන්නව සිටිනවා ඒ නිසා අලුත් රජෙක් ඕනෑ නෑ “

“එහෙම කියලා රැජින ඔප්පු කරන්න ඕනේ රැජින නියම රැජිනක් කියලා ඔප්පු කරන්න ඕනේ නැත්නම් අනිත් රාජධානි තුනෙන් කවදහරි යුද්ධයක් පටන් ගත්තොත් රැජින බයටම පැනලා යයි...”

“මේ තරම් රැජිනට නින්දා කරන්න ඔබට කොහෙන් ආපු හයියක්ද”

“නින්දා කරනවා නෙවෙයි..අපි ඇත්ත කතා කරනවා.රැජිනට හොඳට සටන් කරන්න පුළුවන් කියල ඔප්පු කරනවා නම් අපි ඒක පිළිගන්නවා. රජකමට සුදුසු වෙනත් අයෙක් සමග රැජිනට සටන් කරලා ඔහු පරාජයට පත් කර පෙන්වුවොත් අපි පිළිගන්නවා ඇය හොඳ රැජිනක් කියා “

“කවුද ඔය කියන කෙනා”

“ ලී වුන් කුමරු ඔහු රජකමට ඉතා සුදුසුයි”

“ඒ වුණත් රැජින සිටියදී වෙනත් රජකු පත්කිරීම පිළිබඳව අපි තරයේ විරුද්ධයි “

සුපුරුදු පරිදි රාජ සභාවේ උදේ පාන්දරම  සුපුරුදු කලබැගෑනිය  පටන්ගෙන තියෙද්දි රැජින මේ දිහා නොබලාම ඇය වෙනත් වැඩක යෙදී සිටියේය. ඇය සිංහාසනයෙහි වාඩි වී ඇගේ අතේ තියෙන  පලතුරු වට්ටියෙන් රසම මිදි ගෙඩි  තෝරමින් සිටියේය...

සමහර අය රැජිනගේ පැත්තට කතා කරද්දි තවත් සමහරු ඒ අයගේ මතවල සිටියා ලී වුන්  කුමරු එම කතාවට සම්බන්ධ නොවී රැජින දෙස බලා සිටියේ ඇය මින් ආදිපාදවරයා ව තඹ සතේකටවත් ගණන් නොගෙන මිදි ගෙඩි තෝරන දිහයි අඩුම තරමේ ඇයට  රාජ සභාවේන් ඇයව එළවලා දාන්න කුමන්ත්‍රණ ගහනවා කියලා  වත් ගානක් තිබුනේ නම් නෑ...

“ආහ්හ් හම්බවුණා මේක තමා රහම මිදි ගෙඩිය ‘’

රජින එසේ පවසා කෑගහගෙන සිංහාසනයෙන් නැගිටගෙන සතුටින් කෑ  ගසා ආපහු සිංහාසනේ වාඩි වුවා

එකපාරටම සද්දෙ නැවතුනේ ඇයි කියලා බලන්න ඔලුව උස්සා බැලූ ඇය අතේ තිබූ පලතුරු භාජනය පැත්තකින් තැබුවේ කිසිවක් නොවූ ගානට ය “

“මේක වෙන්න දෙන්න බැහැ රජිනියනියනී

රජිණිය සිටිද්දී වෙනත් රජෙකු ගෙන ඒමට අවශ්‍ය නෑ “

“ඒක ඇත්ත එහෙම කරන්න බෑනේ”

ඇය එසේ පවසා ඇස්කලස්  වරුන් දෙස බලද්දී ඇය දුටුවා ඔවුන්ගේ ඇස් වලින් තරහටම ගින්දර පිට වෙනවා වගෙ

“එහෙනම් ඔබ රජකමට සුදුසුයි කියා ඔප්පු කර පෙන්වන්න “

පළමුව මින් ආදිපාදවරයා එසේ පවසද්දී රාජ සභාවේ ලොකු කුසු කුසුවක් ඇතිවුණා

“ඔව් ඒක හොඳයි එසේ කර පෙන්වන්න “

හැමතැනින්ම කෑගහලා එක එක අය කියද්දී රජින “කෑගහන්න එපා ඔයාලා කියන එකක් කරමු “

රජින එසේ පවසද්දී මින් ආදිපාදවරයා ඇතුළු හැමෝම පුදුම වූයේ රජින එසේ පවසයි කියා ඔවුන් කිසිසේත් බලාපොරොත්තු නොවූ නිසාය

“ඇත්තට”

“ඔව් ඔබලා පැවසූ ආකාරයට අපි තරගයක් තියා බලමු ...අද ට රාජ සභාව අවසන් ...”

එසේ පවසා රජින රාජ සභාවෙන්  පිටව ගියා හැමෝම පුදුම වුණා

ලී වුන් කුමරු පුදුම උනෙත් නෑ. පුදුම  උන් නැත්තෙත් නෑ ඒ නිසා සටන දවසට මොනා වෙයිද කියලා එයා දැනගන්න හිටියේ  නොයිවසිල්ලෙන්...

හෙයුන් රැජිනිය කොරිඩෝ දිගේ ඇවිදගෙන ගියේ බිම දිගේ ඇදෙන ඇගේ සලුවත් එක අතකින් අල්ලගෙන යි...ඒ අතරේ ඇය දැක්කා සඳලුතලෙන් පල්ලෙහා උද්‍යානයේ ඇඳ බැඳ ගන්නා ඉතා චමත්කාර මනරීය දර්ශනයක් ...

"ඒ මකර තටු වල ලස්සන "

ඇය පැවසුවේ සද්දන්ත උද්‍යානයේ දිග ඇරිලා නිදාගෙන ඉන්න සුදු පාට මකරා දිහා බලාගෙනයි...

කොඳු නාරටිය දිගේ ඇදෙන නිල් පාට හා රතු පාට ඉරි නිසා මකරා ගේ ලස්සන තවත් වැඩි වෙලා පෙනුණා ...

"එයා මෙහෙ ආවා විතරයි පෙනුමත් වෙනස් කරගෙන"

මාලිගාවේ රැජිනගේ ප්‍රධාන පාලිකාව ඒ අසලට එන ගමන් පැවසුවේ උද්‍යාන යේ සිටින මකරා දෙස බලාගෙනය.

"එයා ඉතින් කොහොමත් මකරෙක් නේ"

"තේරෙන්නේ නැද්ද..?ඔයාගේ මාලිගාව ඉස්සරහ ඒ සද්දන්ත මකර තටු දිග ඇරගෙන ඉන්නේ එයාගේ බලය පෙන්නන්න මිස වෙන මොකටද ...?"

"ඕ~~~ එහෙමත් එකක්ද ...?මට එහෙම දෙයක් හිතුණේ නෑ කලින් "

මේ සඳලුතලයේ පල්ලෙහා උද්‍යානයේ දිග හැරිලා සිටි සද්දන්ත මකරා වෙන කවුරුත් නෙවේ ලී වුන් කුමාරයයි.

රාජ්‍ය උරුම කරුවන් ගෙන් මකරෙකු ට වෙස් මාරු කර ගැනීමට හැකියාවක් තිබුණේ ඔහුට විතරයි. එම නිසා ඔහුගේ මකරා අනිත් හැම මකරෙක් ට ම වඩා සද්දන්ත උනා...

ඒත් එක්කම මකරා ලග හිටපු කෙනෙක් හේයුන් රැජින ලගට දුවගෙන ආවෙ දෙයක් කියන්න වගේ..

ඔහු ලී වුන් කුමරු ගේ ප්‍රධාන ආරක්ෂකයා වගේම ඔහුගේ හොඳම මිතුරා යි

“ඔයා මොකද දුවගෙන ආවේ වැදගත් දෙයක් කියන්නද ...?”

“ඔයා හෙට ලී වුන් කුමරු එක්ක කඩු සටනක් තියෙනවා ලු නේද ?”

“ඇයි අහන්නේ”

“සුබ පතල යන්න ආවේ ...ඔහු රජ වුණා කියලා මට ඇති හොඳක් නෑ . මට වැඩ වැඩි වෙන එක විතරයි වෙන්නෙ ඒක නිසා වාසි පැත්තට කතා කරලා යන්න ආවේ “

“ඒත් එක්කම රජින හයියෙන් හිනා වෙන්න ගත්තේ අතින් මූණ වහගෙන යි”

“එහෙනම් පස්සෙ හමුවෙමු “

...සැලසුම් කරපු විදිහට රජිනගේ හා ලී වුන් කුමරුගේ සටන නැරඹීමට බොහෝ දෙනා ලක ලෑස්ති වී සිටියා...

වටේටම අමාත්‍ය ආසන වල වාඩිවෙලා දෙන්න යන්නේ මොකක්ද කියලා බලාගෙන හිටපු හැමෝගෙම ඇඟට දාඩිය දාලයි තිබ්බේ...

“ඔයාට මේක කරන්න ඕනිමයි කියලා විශ්වාසද?”

“ඇයි ඔබ සිතා සිටින්නේ මා පළමු වතාවට කඩුවක් ඇල්ලුවා කියලද ?”

“ඒ වගේ තමා පේන්නේ”

ලී වුන් කුමරු පවස්ද්දි වටේ සිටි සැමටම හිනා ගියත් හේයුන් රජින ඒවා ගණන් ගත්තෙ නෑ...

“මං දන්නවා මේ ගැන ඔයාලා කලින් ඉඳන් සැලසුම් කරා කියලා...ඒ වුණත් මන් මොනවත් කරේ නෑ මේක නවත්තන්න.”

හේයුන් පැවසුවේ ලී වුන් කුමරුට පමනක් ඇසෙන සේය

“ඔයාට කොහොමත් ඒ ගැන මොනවත් කරන්න බෑ “

ලී වුන් කිමරු කියද්දි හේයුන් ඇගේ අතේ තිබූ කඩුව කුමරු දෙසට විසි කළේ හැමෝම ආසනවලින් නැගිටිද්දි යි...

"යුද්ධ කරන්න ඕනේ නෑ ..."

රැජින එසේ පවසද්දී මුන් ආදිපාදවරයාගේ මූනේ සමච්චල් සහගත හිනාවක් ඇඳුනේ හිතපු දේම වෙන්න යන නිසා

"මම ලී වුන් ට රජකම බාර දෙනවා..මම පරාදේ බාරගන්නවා ..."

රැජින එසේ පවසද්දී ඇස්කාඩෝ වරුන්ගේ මූනේ නම් එච්චර පුදුම සහගත කමක් තිබුනේ නෑ ඔවුන් මුලින්ම රැජින ගැන එතරම් බලාපොරොත්තු තියාගෙන සිටියේ නෑ .

තමන් වෙනුවෙන් මෙච්චර කල් කතා කරපු තමන්ගේ අය තමන් දිහා පහත් විදියට බලනවා කියල රැජිනට ඒ වෙලාවේ තෙරුන් ගියා ...

"මම ලී වුන් කුමරු ට රජකම දෙන්නම් හැබැයි එක කොන්දේසියක් උඩ..."

"මොකක් ද"

ලී වුන් කුමරු හේයුන් දෙස බලාගෙන ඇහුවේ සැකෙන් වගෙ එයා කොහොමත් දැනගෙන හිටියා රැජින මෙතනට එන්නේ සැලැස්මක් ඇතුව කියලා...

"ඔයා මාව විවාහ කරගන්න ඕනි එතකොට මම ඔයාට රජකම දෙනවා "

හේයුන් කරන්න යන්නෙ මොකද්ද කියලා තේරිලා ඇස්කාඩෝ වරු සතුටින් අප්පුඩි ගහන්න පටන් ගත්තා ..

මින් ආදිපාද වරයාට ලී වුන් කුමරු රජ කරන්නත් ඕනේ එහෙත් ඔහුගේ දියණිය හන් ජොන් රාජධානියේ රැජින කරන්නත් ඕන..එතකොට ලී වුන් කුමරුට තේරුන් ගියා එයාට රජ වෙන්න වෙන්නෙ නැතිවෙයි කියල මොකද මින් ආදිපාදවරයා ඔහුගේ දියණිය හැර වෙනත් කිසිවකු ඔහුට විවාහ කර දෙන්නේ නැති බව ඔහු දැන සිටි නිසා

...එයාට දැනුයි තේරුණේ මින් ආදිපාද වරයාට ඔලුව නමන් හිටියා කියලා එයාට වෙන හොඳක් නෑ කියලා..

ලී චුන් කුමරු කොරිඩෝව දිගේ ඉස්සරහට ගියේ තරහිනි..

"එයා කොහොමද එහෙම කියන්නේ ?එයා කොහොමද එහෙම කොන්දේසි දාන්නේ ..''

මින් ආදිපාදවරයා ඒ විදිහට කෑගගහා ඔහුගේ කාමරයේ බඩු පොළොව ගැහුවෙ කේන්තිය පාලනය කර ගැනීමට නොහැකි නිසා යි.

හැමෝම ඒ දිහා බලාගෙන හිටියේ බය වෙලා වගේයි.ලී චුන් කුමරු ගොස් මින් ආදිපාදවරයා ට කෑ ගැසුවේ

"ඔයා මේකට මොනාහරි කරන්න ඕනේ ...මහලොකුවට කිව්ව නේද සැලසුමේ විදිහට වැඩ කරාම ඇති කියලා "

එසේ පවසද්දී මින් ආදිපාදතුමා ලී චුන් කුමාරයා දෙස හැරී බැලුවා

"අපි ඇයව මරලා දාමු...නැත්නම් මේක කරන්න වෙන්නේ නෑ "

"ඔයා හිතන තරම් රැජිණිය මෝඩ නෑ...ඇයි තේරෙන්නේ නැත්තේ ...?"

ඔයා කියන්නේ හන් ජොන් ව විවාහ කරගන්න බෑ කියලද මින් ආදිපාදවරයා කෑ ගසද්දී ඇස්කලස් වරුත් මොනවත් කියන්න ගියේ නෑ ...

ඒ අයත් ඔහේ බලා ගෙන හිටියේ අත් දෙකත් පස්සට බැඳගෙනයි...

"මං එහෙම නෙවෙයි කියන්නේ අපි එයා කියන දේට කැමති වෙමු. අන්තිමට අපිට කරගන්න ඕන දේ වෙනවා මම රජ වුනාට පස්සේ කොහොමත් රැජිනගේ කරදරෙන් බේරෙන්න පුළුවන් වෙයි "

"ඒකත් ඇත්ත හැබැයි ...ඔයා රජ වුණාට පස්සේ ඔක්කොම ප්‍රශ්න ඉවරයි "

මින් ආදිපාදවරයා එසේ පවසා හිනා වෙද්දි  අනිත් අයත් ඒ එක්කම හිනා උනේ වෙන්නෙ මොකක්ද කියල තේරුනේ නැතත් තේරුණා වගේ රඟපාන්න ඕන නිසා ...

"එතකොට ඔයා මේකට කැමතිද"

"ඔව්...හැබැයි එක දෙයක් ඔයා හේයුන් ද විවාහ කරගන්නා විට හන් ජොන් ව උප බිසව විදිහට විවාහ කරගන්න ඕනේ "

"ඔබට අවශ්‍ය විදියටම ඒක සිදුවේවි"....

"රැජිනි ඔබට විශ්වාසද මේ පිළිබඳ "

"ඔව් අනිවාර්යෙන්ම  මින් ආදිපාදවරයා ලීවුන්ට හන් ජොන් හැර වෙනත් කිසිවකු විවහා කර ගැනීමට ඉඩ ලබා දෙන්නේ නෑ "

රැජිනියේ පැවසුවේ මින් අධිකාරිවරයාගේ කූට උපක්‍රම කිසිවක් නොදැන ය.

රැජිණිය රාජ සභාවට යද්දි ආදී පාදිලිවරුන් ඔවුන්ට හිමි ආසන වලින් වාඩිවී සිටියේය .

රැජිණිය රාජසභාවට ඇතුළුවී සිංහාසනයේ වාඩිවී අතින් ඉඟි කලේ රාජ සභා වාරය ආරම්භ කිරීම කියයි ...

"රැජිණියනි...අපි සම්මතයකට ආවා "

"මොකක්ද? ඔබලා මට පාඩුවේ මගේ රාජකාරිය කරගෙන යාමට ඉඩ ලබා දෙනවාද?"

රැජින දුටුවා මින් ආදිපාදවරයාගේ මුහුණේ අමුතු හිනාවක් ඇදෙනවා එය එතරම් හොඳ කාරණාවක් නොවන බව රැජිනට වැටහී ගියා.

"රැජිනගේ විවාහය ඇස්කලස් පෙලපතෙ ලී වුන් කුමරු සමඟ පැවැත්වීමට අපි ඔක්කොම එකඟතාවයකට ආවා..."

ඒ ප්‍රකාශයත් සමග රජිනිය හොඳටම පුදුම වුණේ ඇය කිසිසේත් බලාපොරොත්තු නොවූ දෙයක් සිදු වූ නිසාය හේයුන් ලී චුන් කුමරුව විවාහ කරගත්තේ නැත හොත් අයට ඉක්මනින්ම අනාතයෙක් විදියට මැරිල යන්න වෙනව කියල ඇයට තේරුම් ගියා.

හැබැයි ලී චුන් කුමරු විවාහ කරගත හොත් රාජ්‍ය යේ අගබිසව විදිහට ඇයට ලොකු බලයක් හිමි වෙනවා කියලා තේරුණා ...

“මේ විවාහය ස්ථිර කරලා රජිනිය කුමරුත් සමග ගිවිසුමකට එන්න ඕනේ මෙතීරණය පස්සේ වෙනස් කරන්න බෑ..”

“හරි... ඉන්න ඊට ඉස්සෙල්ලා තව දෙයක් තියනවා ... මම ලී චුන් ට රජකමත් දෙනවා බලයක් දෙනවා හැබැයි ඔහුට කිසිම උප බිසෝවරු වත්

අන්තඃපුර සේවිකාවෝ වත් ඉන්න බෑ”

රජිනිය එසේ පවසද්දි මින් ආදිපාදවරයා ට මෙය නිසා ඔහු සිතූ කිසිවක් කර ගැනීමට නොහැකි වෙනවා . මින් ආදිපාදවරයා කිසිවක් කීමට ලී චුන් කුමරු සන්දේශයට අත්සන් කළේ නැත්තං එයාට කවදාවත් රජ වෙන්න බැරි වෙන නිසා යි...

ඉක්මනටම රජතුමාගේ වෙනස්වීම සහ අලුත් විවාහ උත්සවේදී ඔටුනු පැළඳීම ගැන දැනුම් දීලා ඇස්රූස් රාජධානිය පුරාම සන්දේශය යැව්වේ ජනතාව දැනුවත් කරන ගමන් ....

මේ ගැන රටේ ජනතාවට තිබුණේ පැහැදිලි නැති අදහසක් .ඒ වුණත් ඒ අයට රාජ්‍ය උරුමය පිළිබඳව ප්‍රසිද්ධියේ කථා කිරීමට නීතියෙන් තහනම් වූ නිසා කවුරුත් මොනවත් කිව්වෙ නැත්තෙ මේ සියල්ල මින් ආදිපාදවරයාගේ කපටි සැලසුම් කියා දැන සිටි නිසාය ...

සතියක් වගේ කෙටි කාලෙකින් අලුත් රජතුමාට ඔටුනු පැලඳුවේ එම උත්සවයට සතර මහා රාජධානි වලින් විශාල බලවතුන් පැමිණීමත් සමගය

මෙමෙ මොන හේතුව නිසා ඇස්රූස් රාජධානියේ ආරක්ශාව ඉතාමත් තරකර යි තිබුනේ

සතර මහා රාජධානි හතරටම ලොකු ආරක්ෂාවක් තිබුණා ... ඒ අතරින් වැඩිම ආරක්ෂාවක් තිබුණේ ඇස්රූස් රාජධානිය ටයි

ඇස්රූස් වල හිටපු මකරුන්ට විශේෂ බලයන් තිබුන නිසා ඒ අය රාජධානියට ලොකු බලයක් යොදවලා තිබුණා...

වෙන රාජධානියක කෙනෙක් ඇස්රූස් වලට ආපු ගමන් ඒ අයගේ බලයන් අඩපණ වෙනවා ...මේ නිසා වෙන රාජධානිවල රජවරුන් ආවා කියලා කවුරුත් බය උනෙ නෑ...

හැබැයි ඇස්රුස් රාජධානියෙන් පිට ඒ වගේ බලයක් ආරක්ෂාවක් නොමැති නිසා ජනතාව ඇස්රුස් වලින් එළියට නොගිය තරම්...

“ඔයාලා මට මොනවත් කරදරයක් කරන්නේ නෑ නේද ඇත්තටම මම ඔයාල හිතන විදිහේ කුමන්ත්‍රණ කරන්නේ නෑ “

හේයුන් පැවසද්දි ඒ කටහඬේ කොච්චර ඩේ කොච්චර අසරණකමක් ගැබ් වෙලා තියෙනවා ද කියලා ලී වුන් ට තේරුන් ගියා

“මම ඔයාට කරදරයක් කරන්නේ නෑ ඒ වුණත් ඔයා ඔහොම කියද්දී මට හිතෙනවා ඇත්තටම ඔයාගේ මොකක් හරි හොරයක් තියෙනවා කියලා”

“නෑ නෑ මම ඇත්තමයි කියන්නේ ‘’

එහෙනම් ඔහොම හැසිරෙන්න එපා ...මම කොහොමත් හිතන්නේ නෑ ඔයා ඒ විදිය දෙයක් කරයි කියලා ඒ උනත් ඔයා හැමෝම ඉස්සරහ ඔහොම වෙවුලන්න ගත්තොත් ඒ අය හිතයි ඔයා කකුල් දෙකෙන් හිටගෙන ඉන්න බැරි තරම් දුර්වලයි කියලා “

ලී වුන් කුමරු උද්‍යානය දෙසට ඇවිද ගියේ හිත සංසුන් කර ගැනීම ටය

ඔහු දුටුවා උද්‍යානයේ කෙලවරේ සිටින අයෙක් ඔහු දෙස බලා සිටින බව ඒ මින් ආදිපාදවරයා ගේ දියනිය් හ්න් ජොන් වුවා. ඇයව දුටු විට හිතේ ඇතිවූ ඇති වූ අනුකම්පාව නිසා ලී වුන් රජු ඇයට කතා කිරීමට ඇය අසලට ලන් වූවා ...

හන් ජොන් කුඩා කල පටන් ලී වුන් කුමරුට කැමති වූවත් ඒ ගැන කවදාවත් මූනට නොකීවේ කුමාරයාගෙ හිත තිබුනේ හේයුන් කුමරිය ලග නිසයි

ලී වුන් කුමරු හැමදාමත් හේයුන් කුමරිය සමග රණ්ඩුවට ගියේ ඇයත් සමඟ කතා කිරීමට අවශ්‍ය වූ නිසයි...

ලී වුන් කුමරු හේයුන් ව විවාහකර ගැනීමට යන බව දැන ගත් පසු හිත යටින් දුක් වුනත් ලී වුන් කුමරු ගැන සිතා සතුටු වූහ...හන් ජොන් ට මින් ආදිපාදවරයා යා ගෙ කැමැත්ත ට ලී වුන් කුමරු සමග විවාහ වීමට අවශ්‍ය වූයේ නෑ...

“හන් ජොන් මොකද මෙහෙ කරන්නෙ”

“මා ඔබ මුණ ගැසී වඇදගත් පණිවිඩයක් කීමටයි පැමිණි යේ “

“කුමක්ද.?”

“මින් ආදිපාදතුමා ඔයාට හොරෙන් කරන වැඩ වැඩි වෙලා...ඔහු සතියකට සැරයක් වගේ ඇස්කලස් වරුන්ගේ හමුවක් තියනවා ඔබට හොරෙන්..”

හන් ජොන් කියද්දී ලීවුන් හන් ජොන් දිහා බැලුවේ පුදුමයකින්..

“ඇත්තට ?”

“ඔව්”

හන් ජොන් එසේ පවසද්දි ලී වුන් කුමරු කට කොනට හිනාවක් ගත්තේ “එයා මොනවා කරනවා කියලද හිතාගෙන ඉන්නේ “...

රජතුමා සද්දන්ත තණ පිට්ටනියක් ඉස්සරහ හිටගෙන හිටියේ අත් දෙකත් බැඳගෙන යි...

ඒ තණ පිට්ටනිය වටේටම හිටපු එළදෙන්නු නිසා තන පිට්ටනියේ තැනින් තැන පාලු මැකිලා තිබුනත් ඒ ඇර විශේෂ දෙයක් එහි දැක ගන්නට තිබුනේ නෑ ...

“රජතුමනි අපි යන්නේ නැද්ද “

“මේ පැත්තේ තියෙන්නෙ ඇස්රූස් වල මොන දොරටුව ද ..?”

ලී වුන් කුමරු ඔහුගේ ප්‍රධාන ආරක්ෂකයා ගෙන් ඇහුවෙ ඔහුගේ අශ්වයා දිහාට ආපහු ඇවිත් අශ්වයාගේ පිට නගින ගමන් ය...

“දකුණු දොරටුව “

“මේ පැත්තට කිසි ආරක්ෂාවක් නැනෙ ඇයි ඒ...?”

“රජතුමාගේ අණ නිසා මනේ”

රජුගේ ප්‍රධාන ආරක්ෂකයා කියනවා ඇහිලා පුදුමයෙන් ඔහු දෙස බැලුවා

“මම කිව්වා ..? “

“ඔව් ...මේ මේ පැත්තට ආරක්ෂාවට යොදවලා තිබුණ හැම සේවකයෙක්ට ම පණිවිඩය දුන්නා මෙතනට ආරක්ෂාවක් අවශ්‍ය නෑ කියලා ...ඒ නිසා අපි මුර කඳවුරු අයින් කරා...”

“කවුද ඔයාලට එහෙම කිව්වේ ...?මම එහෙම දෙයක් කිව්වේ නෑ “

“රාජ අණක් තමයි ආවේ “

"මෙතනට ආරක්ෂාව දැන්ම යොදවන්න...මෙතනින් ආපු ගියපු අය ගැන හොයලා බලන්න...ඇස්රූස් ඇතුලේ කවුරුහරි සැකකටයුතු කෙනෙක් ඉන්නවද කියලත් හොයල බලන්න..."

“ඇයි මොකද උනේ”

ලී වුන් කුමරු ආපහු මාලිගාවට යන්න හැරෙනවා දැකලා මකර සේනාව මෙහෙයවන්නා ඇහුවේ කුතුහලෙනි...

“මොකද මම එහෙම රාජ අණක් දුන්නේ නැති නිසා...කවුරුහරි මෙතන ආරක්ෂාව අඩු කරලා තියෙන්නේ මෙතනින් කවුරුහරි ඇස්රූස් ඇතුලට ගෙන්න ගන්න තියන උවමනාවට...”

ලී වුන් කුමරු අශ්වයාගේ පිටෙන් බැස්ස ගමන් ගියේ රාජ සභාවට...හදිසියේම රාජ සභාව කැඳවීම නිසා හදිස්සියේම අමාත්‍යවරු අශ්ව කරත්ත වලින් එන්න පටන් ගත්තා ....

ලී වුන් කුමරු සිංහාසනයේ වාඩිවී සිටියේ දැඩි කෝපයෙනි...

හේයුන් කුමරිය වෙන්නේ මොකක්ද කියලා දැනං හිටියෙ නෑ ...එයාට දැනගන්න උවමනාවක් තිබ්බෙ නෑ ...

ඒ වුණත් ඇය ලී වුන් කුමරුට එහා පස වාඩිවී පලතුරු භාජනයක් අතේ තියාගෙන වෙන දේ බලාගෙන හිටියේ ඇපල් ගෙඩියකුත් කකායි...

එතනින් ගියපු මැස්සෙක් වත් හේයුන් කුමරිය තරම් සන්සුන්ව සිටියේ නෑ...

මොකද එතනින් ගියපු මැස්සෙක් තරම්වත් හේයුන් කුමරිය වෙන්නේ මොකක්ද කියලා දැනගෙන හිටියේ නැති නිසායි...

"අද මම දකුණු පළාතට මුර සංචාරයකට ගියා "

"ඇයි හදිස්සියේම...?"

"කට වහගන්නවා...මමයි මෙතන රජතුමා තමුන් කවුද මම කතා කරද්දි මැදින් පැනලා මම ගියේ කොහිද කියා අසන්න..."

රජු එසේ පවසද්දි රාජ සභාවේ ඝෝෂාව ඒ සැනින් නැතිවී ගියා...හැම අමාත්‍යවරයෙක් ම බිම බලා ගත්තේ ඒ අයගේ මෙච්චර වෙලා තිබුන සතුටු සාමීචිය නවත්තලා දාලායි...

"මම ඒ වෙලාවේයි දැනගත්තේ දකුණු පළාතේ දොරටුව ළඟ ආරක්ෂාව අඩු කරල කියලා...කවුරුහරි රාජ මුද්‍රාව භාවිතා කරලා තියෙනවා ...මම මේ හැමෝටම මතක් කරලා දෙන්නේ අන්තිම වතාවට රාජ මුද්‍රාව රජුට පමණක් භාවිතා කිරීමට හැකි දෙයක්...

කවුරුහරි රජතුමාගේ අණට පිටින් ගිහින් මාලිගාවේ ඇතුළෙ හෝ මාලිගාවෙන් පිටත රාජ බලයට වඩා බලයක් පැතිර වුවොත් ඒ කෙනා රාජ ද්‍රෝහියෙකු විදිහට නම් කරලා ජීවිතය අවසන් කරන්නේ මගේ අත් දෙකෙන්මයි..."

ලී වුන් කුමරු කෝපයෙන් කෑගැහුවා...ඒ ඇස් කෝපයෙන් දිගැදිලා...ඔහුගේ අත්වල හා බෙල්ලේ නහර ඉලිප්පිලා ...

"මන් මේ ගැන පරීක්ෂණ කිරීමට සොල්දාදුවන්ට අණ කරනවා...මේකට සම්බන්ධ හැම නිලධාරියෙක් ගැනම මම පෞද්ගලිකව ක්‍රියාමාර්ග ගන්න වා .."න්

ලී වුන් කුමරු එසේ පවසද්දී මින් ආදිපාදවරයා ඒ දෙස බලා සිටියේ ගිනි ගන්නා කෝපාශ්‍රිත දෑස් වලිනි...

මාලිගාවෙ මෙ දවස් වල හැම තැනම වෙන පරීක්ෂණ නිසා ඇස්කලස්වරුන්ගේ හුගක් හොර වැඩ නැවතිලයි තිබුනේ ...

අමාත්‍යවරුන්ට පක්ෂපාතී සොල්දාදුවො හිටියත් වැඩි ප්‍රමාණයක් සිටියේ රජතුමාට පක්ෂපාතී සොල්දාදුවොයි ...

රජු ඇස්කලස් වරුන්ගේ හොර ගබඩා හැම එකක්ම වගේ සොල්දාදුවන් යවා මන්කොල්ල කෑවේ කාටත් හොරෙනි ...

හන් ජොන් ගෙන් ලැබුනු තොරතුරුයි ඔත්තුයි නිසා රජුට තවත් වැඩෙ ලේසි වුනි .

මෙ නිසා අමාත්‍ය වරුන්ගේ ගබඩා වැඩි කාලයක් යන්න කලින්ම හිස් වුන නිසා එ අයගේ ඔලුව රත්වෙලයි තිබුනේ ...

එ ගැන කාටවත් පැමිනිලි කරන්නත් බැරි වුනේ එ හැම එකක්ම වගේ හොර ගබඩා නිසායි ...

තව දුරටත් රජු ගැන ඇස්කලස් වරුන්ට කිසිම විශ්වාසයක් නම් තිබුනේ නෑ ...

මින් ආදිපදිතුමාට පිටින් යන්න කැමැති උනු ඇස්කස්වරුයි, ඇස්කාඩොවරුයි පෙලපත් නාම තනතුරු අමතක කරලා දාලාම ලී යුන් රජුගේ පැත්තට පක්ෂපාතී උනේ මින් ආදිපාදිතුමාට පිටින් යන්න රජුට බලයක් තියෙන බව දැකලා

හන් ජොන් අශ්ව කරත්තෙකින් හදිස්සියෙන් වගේ මාලිගාවට ඇවිත් උද්‍යානයේ පැත්තක වාඩිවෙලා හිටපු හේයුන් කුමරිය ගාව ඉස්සරහා නැවතුනා... එය දුටු ලී වුන් කුමරුත් ඒ අසලට පැමිණි යේ කලබලය කුමක් ද කියා සොයා බැලීම්ටයි...හන් ජොන් හේයුන් කුමරිය ලග එක පාරටම දන ගැස්සුනා

“දෙය්යියනේ ඔබට කුමක් ද මේ සිදු වූයේ “

සේයුන් හන් ජොන් ව උරහිස් වලින් අල්ලලා නෙගිට්ටෙව්වත් හන් ජොන් ගෙ ඇස් වලින් එක දිගට ඇස් වලින් කදුලු ගලද්දියි....

“මොකද උනේ?”

හැමෝම ඇයගෙන් ඇහුවත් හැට කලේ හඩන එක පමනයි...

“මට සමාවෙන්න ...?

හන් ජොන් පැවසුවෙ කඳුලු පිහදාන අතරතුරයි ඒ වුනත් එයා කතා කරන වෙලාවට ඇයගේ  උරහිස් ඉහල පහල ගියේ එයා ආමාරුවෙන් හුස්ම ගන්න වේගෙට තාලේ කියන්න වගෙයි...

ඇය අමාරුවෙන් කැස්සෙ වචනයක් වත් කියා ගන්න බැරුව අසරණ වෙලායි..

“මින් ආදිපාදවරයා හැමදේම දැනගෙන...”හන් ජොන් පැවසුදේ අමාරුවෙන් හුස්ම ගන්න අතර තුරෙයි.

“ඒකට කමක් නෑ “

හන් ජොන් ඇයගේ සලුව පහතට දමා ඇයගේ හම පෙන්වූ විට හැමෝගෙම දෑස් පුදුමයෙන් විසල් වෙද්දියි...

හන් ජොන් ගේ සිරුරේ සෑම තැනකම වගේ පිලිස්සුනු තැවාල කැලැල් තිබුනා

ඒවා රත් කෙරූ අශ්ව ලාඩමකින් තිබූ ඒවායි..එම පිච්චුනු තුවාල කැලැල් දුටු විට ලී වුන් කුමරුගේ දෑසෙමුත් කඳුලක් ගලා ගියා...

“මම ඔහුට ගොඩක් දේවල් පැවසුවා මට ඔහු ඉදිරියේ ඒවා නොකියා සිටීමට නොහැකි වූවා ‘’

එය කියා ඉවර වෙනවාත් සමගම ඇයට ලොකු කැස්සක් ආවේ කැස්සත් සමගම ඇයගේ කටින් රුධිරය පිට වෙද්දියි...

“කුමක් ද සිදු වන්නේ ඇයි රුධිරය පිට වන්නේ ?..”

“බය වෙන්න එපා රාජකීය වෙදදුරු දැනටමත් එන ගමන් “

“එයාගේ හැටි එහෙම තමා  එයාට කරදරයක් වෙන අයගෙන් එයාට වැඩක් නෑ...”

එයා එහෙම කියන්වත් එක්කම වාඩි වී  සිටි තැනින් බිමට වැටුනේ තවත් ශරීරයට දරා ගැනීමට නොහැකි වූ නිසායි...

"එයා මාව වදපු මගේ පියා... ඇයි ඔහු මට මෙහෙම දෙයක් කලේ ඔහු ට මා ගැන පොඩිම ආදරයක් වත් තිබුනේ නැද්ද...!?"

එයයි ඇයගේ අන්තිම වචන ටික වූයේ... ඇය අවසන් හුස්ම හෙලුවේ සේයුන් කුමරියගේ දැත් උඩයි...!!

හන් ජොන් ගේ අවසන් කටයුතු සිදු වූයේ මාලිගාවෙමයි ඒ සඳහා මින් ආදිපාදවරයා කිසි සහයෝගයක් දැක්වූයේ නෑ ...

හන් ජොන් මැරෙන්න යන්නේ කියලා දැන දැනත් අන්තිම තප්පර වෙන තෙක් ම ලී වුන් කුමරුට උදව් කලේ ඇයගේ හිතේ තිබූ ආදරය නිසයි.

.ඔහු වෙනුවෙන් ඇයගේ ආදරය පූජා කලා.ලී වුන් කුමරුට කවදාවත් ඇය හිතන විදිහේ ආදරයක් දීමට නොහැකි වූයේ ඔහු සේයුන් කුමරියට ආදරේ කළ නිසයි...!

මින් ආදිපාදවරයා වරදින් බේරීමට අවශ්‍ය නිසා හන් ජොන් ඔසු පැන් ගෙන ඒමට වනාන්තරයට ගිය වෙලාවේ විස කටුවක් ඇනී මියගොස් බව ආරංචිය පැතිරෙව්වා ...

හන් ජොන් ගේ මරණය පිලිබඳ සේයුන් කුමරියත් හුගක් දුක් උනා...

මේ කරදර අතරතුර සේයුන් කුමරිය නිදා සිටින අතර තුර ගෝර්ගන් සතෙකු ඇයට පහට දුන්නෙ ඇයගේ ජීවිතයටත් මරණීය තර්ජනයක් ඇති කරමිණි... ඇයගේ ජීවිතය බේරුණේ ලි වුන් කුමරු හරිම අවස්ථාවේ එතැනට පැමිනි නිසාය

ගෝර්ගන් කියන්නේ ඇස්රූස් රාජධානියට ඉන්න ලොකුම හතුරායි...

ගෝර්ගන් සත්තු හිම ආශ්‍රිතව ඉන්න ඕනෑම සතකු ආහාරයට ගන්නවා.

ඇස්රූස් කියන්නේ සතර මහා රාජධානි වලින් සෘතු හතරෙම ලාවට හරි හිමෙන් වැසෙන රාජධානියකි...

ඒ නිසා ගෝර්ගන් සත්තුන්ගෙන් බේරෙන්න ආස්රූස් වල දොරටු වලට විශාල ආරක්ෂාවක් යොදවලා යි තියෙන්නේ .

ගෝර්ගන් සත්තු දඩයමට කලින් තමන්ගේ ගොදුර මෝහනය කරනවා සම්පූර්ණයෙන් මෝහනයට ලක් වුනොත් ඒ අය අනිවාර්යෙන් මරණයට පත්වෙනවා...

මෝහනයට පත් වෙලා ඇස් දෙක වැහෙන්න කලින් උරහිසට තදින් පහරදී මෝහනය බිඳින්න හැකියාව තියෙනවා නමුත් එයින් මිදීමට තවත් ටික කාලයක් ගත වෙනවා ...

මනුස්සයෙක් කියන්නේ ගෝර්ගන් සතෙකුට පොඩිම පොඩි ගොදුරක් .

ගෝර්ගන් සතෙකු ට නිල ඇට තුනක් තියෙනවා එයින් එකකට හෝ හරියට පහර දුන්නොත් ඔවුන් එක පාරින්ම මිය යනවා.

"එහෙනම් දකුණු දොරටුවෙන් ඇතුළු ට ආවේ මෙයයි...?

"මෙහෙම වෙන්න දෙන්න බෑ අපි පත් කරපු රජතුමා අපිට විරුද්ධවම කටයුතු කරනවා "

**"අපේ භාණ්ඩාගාර මංකොල්ල කෑව එකත් ඔහුගේ සැලැස්මක් "**

ඇස්කලස් වරුන්ගේ කතාබහ අස්සෙ මින් ආදිපාදවරයා සිටියේ පැත්තකට වී වයින් වීදුරුවක් හිස් කරන ගමන් ය...

**"අපි රජතුමාව මරලා දාන්න ඕනේ ඔක්කොටම කලින් "**

මින් ආදිපාදවරයා පවසද්දී හැමෝම ඔහුට ඇහුම් කම් දුන්නා..

ඔහුව මරණ එක එතරම් ලේසි නෑ ඔහු මකරෙක් නිසා .ඔහු සේයුන් වගේ රූකඩ රජයේ නෙවෙයි.ඒ වගේම ඔහු ඉක්මනින් කේන්ති ගන්න කෙනෙක් ඒක නිසා ඔහුව මරණයට පත් කරන එක ඒ තරම් ලේසි පහසු දෙයක් නොවෙයි කියලා හැමෝම දැනගෙන හිටියා... නමුත් මින් ආදිපාදවරයා දෙයක් කියන්නේ විහිළුවකට නෙමෙයි කියලා ත් හැමෝම දැනගෙන හිටියා..

**"එක එක්කෙනා රාජාසනය ට යවලා අපිට බලය ලබා ගන්න බෑ... ඒකට මම ම යන්න ඕනේ ...!"**

මින් ආදිපාදවරයා දැන් සිටියේ බලයෙන් තණ්හාවෙන් වියරු වැටිලා යි.

ඔහු තමන්ගේ එකම දරුවත් අවසානය වෙන තෙක් ප්‍රයෝජනයට ගෙන මරලා ගිනිතියලා දාපු ඔහුට කිසිම කෙනෙක් ගැන අනුකම්පාවක් තිබුණෙ නැහැ...

ඒ අතරේ ආදිපාදවරයා ඔලුව උස්සා බැලුවේ ඇතුලට එන කෙනෙකු දුටු නිසයි ඔහුව දුටුවිට ආදිපාදවරයාගේ දෑස් වලින් ගිනි පුපුරු පිට වුණා ...

**"තමුම් කුමක් ට ද මෙහි පැමිණියේ**

මා තමුන්ට පැවරුවේ එක වැඩයි ඒකවත් හරියට කර ගැනීමට නොහැකි වූවා "

**"සමාවෙන්න ආදිපාදිතුමනි"**

**"තමුන් මෙච්චර කල් අපි අල්ලන් හිටපු සතාගෙන් ප්‍රයෝජනයක් ගත්තේ නැහැනේ මම ඌව කොයි තරම් අමාරුවෙන්ද අල්ලගත්තෙ "**

මින් ආදිපාදවරයා හන් සේයොන් සෙනෙවිතුමා ලවා ගෝර්ගන් සතෙකු අල්ලා සේයුන් කුමරිය මරා දැමීමට තැත් කලත් එය සාර්තක වූයේ නැත.

හන් සෝයොන් සෙනෙවිතුමා කොරිඩෝව දිගේ ඉස්සරහට ඇවිද ගියේ බාහෙට මැරුණු මිණිසෙක් ගානටය...

එයාට එයා කරපු වැරැද්ද මතක් වන වාරයක් පාසා නින්ද ගියේ වත් නැති තරම්...ඒ නිසා ඔහුට මින් ආදිපාදවරයා හමුවීමට අවශ්‍යවූයේ නැත...

**"රජතුමණි..!"**

රජතුමා ඔලුව උස්සලා බැලුවේ ඔහු ඉදිරියේ සිටගෙන සිටින හන් සෝයෝන් සෙනෙවි තුමා දැකලයි...

**"කුමක්ද..?පැවසීමට තිබෙන්නේ"**

රජතුමා එසේ පැවසුවේ හන් සෝයොන් සෙනෙවිතුමා ඇවිත් තියෙන්නේ වැදගත් රාජකාරියකට කියලා තේරිලා...

ඒහෙත් හන් සෝයොන් සෙනෙවි තුමා කඳුළු පිරුණු දෙනෙතින් රජු ඉදිරියේ දණ ගසා ගත්තේ රජු පුදුම වෙද්දියී...

**"මට සමාවෙන්න..."**

**“ඒ මොකටද “**

**“මම යි මාලිගාවට ගෝර්ගන් සතෙකු රැගෙන ආවේ...”**

**“හහ්..?”**

**“ ඒ මමයි ...මට සමාවෙන්න...මන් එහෙම කලේ මින් ආදි ආදිපාදිතුමාගේ**

**කීමටයි...අනේ මට සමාවෙන්න..”**

රජතුමා හන් සෝයොන් සෙනෙවිතුමා ලගට ලන් වෙලා සෙනෙවි තුමාගේ කඩු කොපුවේ එල්ලි එල්ලී තිබුණු කඩුව එලියට ඇදල ගන්නවා සෙනෙවිතුමා ට ඇහුන නිසා ඔහු ඔළුව උස්සා බැලුවා ...

එකපාරටම ඔහුගේ බෙල්ලට කඩුවෙ තුඩ හිර වුන නිසා ඔහු බය වී රජු දෙස බැලුවා...

**“ඇයි ඔබ මට ඒ ගැන පැවසුවේ...”**

**“රජතුමනි.... මා මරා දමනවා නම් මරා දමන්න...!!මා හට අවශ්‍ය නෑ තවත් මේ පව් වලට කරගහන්න..”**

**“ඇයි එහෙනම් තමන් මං ළඟට ආවේ..ඔබට කඩුවෙන් ඇන ගෙන දිවි නසා ගන්නයි තිබුණේ ...”**

රජු පවසද්දී හන් සෝයොන් සෙනෙවි තුමගේ දෑසින් කඳුළු ගලා ගියා...

**“ඒ වුනත් මට මේ දේවල් ගැන රජුට පැවසීමට අවශ්‍ය වුණා..””**

**“මම දන්නවා මේ දේවල් කරන්නෙ මගේ මාමා කියලා “**

**“ඇයි එහෙනම් ඔබතුමා මේයට කිසිවක් නොකරන්නේ “**

හන් සෝයොන් සෙනෙවිතුමා පුදුමෙන් අහද්දි රජතුමා අතින් ඉඟි කරපු නිසා සෙනෙවිතුමා දණ ගහගෙනම රජතුමා ළඟට ඇදුනා....

**"මට ඔබව විශ්වාස කිරීමට හැකිද..?"**

**"හහ්.."**

**"රජතුමාගේ සේවය වෙනුවෙන් අවසානය වෙනකම්ම "**

සෙනෙවිතුමා එහෙම කෑ ගහලා ආඩම්බරෙන් කියද්දී රජතුමා ඒ දිහා ටික වෙලාවක් බලාගෙන හිටියා

...

**"මින් ආදිපාදවරයා ළඟ මගේ දෙයක් තියෙනවා "**

**"කුමක්ද.."**

සෙනවි තුමා අහද්දි රජතුමා එයාගේ නළල වටේ අත් දෙක ගෙනියද්දි ඒ ඔලුව වටේ කැරකුණු නිල් පාට දිලිසෙන ගිනි දැල්ලක් වගේ දෙයක් මැදින් මොනව හරි කහ පාට දිලිසෙනවා සෙනෙවිතුමා දැක්කා ...

රජුගේ නළල මැද රවුම් හැඩයේ කහපාට හිඩැසක් තියෙනවා සෙනෙවිතුමා දැක්කවෙලේ ඔහු බිය වී පිටිපස්සෙන් පිටිපස්සට යන්න පටන් ගත්තේ ඒ දිහා බලාගෙන...

රජතුමාගේ ඒ ගිනිදැල් අතුරුදහන් වෙලා යද්දි සෙනවි තුමා ඒ දිහා බලාගෙන හිටියේ අත් දෙකත් පිටිපස්සට බැඳගෙන...

**"මගේ දේ ඔබ ආපසු මට ගෙනැවිත් දෙන්න ඕන...!"**

**"මින් ආදිපාදීතුමා ළඟද එය තිබෙන්නේ"**

**"ඔව්...මම  පොඩි කාලේ ඉඳන්ම මගේ ධවල මැණික අතුරුදහන් වෙලයි තිබුනෙ...ඒ වුනත් මම දැන් දන්නවා ඒක ළඟ තියෙන්නේ කියලා...ඔබ මට ඒක ගෙනත් දෙන්න ඕන..."**

**"කොහොමද...? මන් ඒක තියෙන්නේ කොහෙද කියලවත් දන්නෙ නෑ..."**

**"මම දන්නවා...ඒක තිබෙන්නේ ඔහුගේ ගෙලේ පැළඳ සිටින මාලයේ යි..."**

රජතුමා කියද්දී සෙනෙවිතුමා පුදුමයෙන් රජතුමා දිහා බැලුවා...

**"ඒ තරම් ප්‍රසිද්ධියේ ආදිපාදතුමා මැණිකක් ගෙනියයිද.."**

**"එයාගේ බලය මං ඉස්සරහ පතුරවන්නේ ඒ මැණික නිසයි ...ඒ නිසයි මට තාමත් එයාව විනාශ කරන්න බැරි වුනේ..."**

**"ඔබ මට එය ගෙනත් දිය යුතුයි.."**

**"අනිවාර්යයෙන්ම...මම එය කොහොමහරි ඔබතුමාට ගෙනැවිත් දෙනවා...'**

හන් සෝයොන් සෙනෙවිතුමා කාමරයට එනවා දැකලා මින් ආදිපාදවරයා ඇත සිටම ඔහු දෙසට විසි කෙරූ මැටි භාජනය සෙනෙවි තුමාගේ ඔළුවෙ වැදිලා හයියෙන් පුපුරා ගියා...

සෙනෙවිතුමා ආදිපාදවරයා ඉදිරියේ දණ ගසා ගත්තේ වෙව්ලන කකුල් වලිනි...

**"තමුන් කුමකට ද මෙහි පැමිණියේ ? තමුන් කිසිම වැඩක් හරියට කරන්න දන්නෙ නෑ.."**

ආදිපාදවරයා කෑගසද්දී සෙනෙවිතුමා ඔලුව පාත් කරගෙන හිටියේ කියාගන්න දෙයක් නැතිවයි...

මින් ආදිපාදවරයා කෑගසද්දී එක පාරටම දොරට කවුරුහරි තට්ටුකරනව ඇසිලා දෙදෙනාම පිටුපස හැරී බැලුවා ...

**“ආදිපාද තුමනි මම ඇතුලට එන්න ද..?”**

**“පැමිණෙන්න”**

සෙනෙවිතුමා දුටුවා කාමරේ ඇතුලට කබායකින් මුහුණ වසා ගත් පුද්ගලයෙක් ඇතුළු වෙනවා...

“තමුන් මොනවද තවත් මෙතන කරන්නේ? යනවා එළියට...”

මින් ආදිපාදතුමා කෑගසද්දී සෙනෙවිතුමා ඔලුව නමාගෙන කාමරයෙන් එලියට ආවා...කොරිඩෝවේ කවුරුත් නොසිටපු නිසා සෙනෙවිතුමා දොරට කන තියා ගත්තේ ඇතුලෙ කතා කරන මොනවත් ඇහෙනවද කියලා ඔත්තු බලන්නයි...

**“ඇයි ඔබ මේ තරම් වෙලා ගන්නේ ?”**

ඒ කට හඬ ඇසෙද්දී සෙනෙවිතුමාගේ ඇහි බැම එකපාරටම ඉස්සී දෑස් පුදුමයෙන් විශාල වුණා..

**“මම ඉක්මනට මේ ප්‍රශ්නය අවසන් කරන්නම් “**

**“ඔබ හැමදාම පවසන්නේ ඕකනේ...”**

**“මන් ළඟ තාමත් ඔහුගේ හදවත තියෙනවා...ඒ නිසා එයාට මට දැන්ම මොනවත් කරන්න බෑ ...**

**“ඔබ සිතනවාද එහෙම...එසේනම් ඔබට මීට කලින් ම ඔය රජකම ඔයාගේ අතට ගන්න තිබුණා...”**

අමුත්තා හයියෙන් කෑගහලා කියද්දී සෙනවි තුමාට ඇහුණා කෙනෙක් තරහින් බිත්තියට ගහනවා...

***"මට සෙයුන් කුමරියව ඕනේ...තමුන් රජකම තියාගන්නවා...මං තමුන්ට කරන්න පුළුවන් හැම උදව්වක් ම කරලා තියෙන්නේ...ඒ වුණත් තමුන් තාමත් වැඩේ වරද්ද ගන්නවා..."***

ඒ කෙනා ආයෙත් හයියෙන් කෑගහනවා සෙනෙවිතුමාට ඇහුණා...ඒ වුණත් ටික වෙලාවකින් ඇතුලෙන් කිසිම සද්දයක් ඇහුනේ නැති නිසා සෙනෙවිතුමා පුදුමයෙන් වැහිල තියෙන දොරපියන් දිහා බැලුවා...

ඒ වුණත් එකපාරටම දොරට යටින් දැකපු හෙවනැල්ලක් නිසා සෙනෙවිතුමා ළඟ තිබුණු මුල්ලකට කොටු වුණේ කළුවරේ සැඟවී යන ගමන් ය...

එතකොටම එකපාරටම දොර ඇරගෙන එළියට ආපු අමුත්තා හිටියේ කඩුවකුත් දික් කරගෙනයි...එයා වටපිට බැලුවේ දොර ළඟ මෙච්චර වෙලා හිටගෙන හිටියේ කවුද කියලා හොයන ගමන් ...

**"ඇයි කුමක්ද සිදුවූයේ"**

මින් ආදිපාදතුමා එළියට එන ගමන් අහනව සෙනෙවිතුමා දැක්කා...

**"මම සිතුවේ මෙතන කවුරුහරි දොරට හේත්තු වෙලා අපි කියපු දේවල් අහගෙන හිටියා කියලයි..."**

කළුවරේ උනත් සෙනෙවිතුමා ට පහලට කරගෙන හිටපු කබාය නිසා අමුත්තාගේ මුහුණ හොඳට දැකගත්තා

ඒ කැස්කස් අමෝරා රාජධානියේ රජතුමායි...

කැස්කස් රාජධානියේ රජතුමා තමන්ගෙ කඩු කොපුව ඇතුලට කඩුව දමා ගත්තා...

**"මම එහෙනම් පසුව පැමිණෙන්නම්..."**

ඔහු එසේ පවසා නැවතත් වසාගෙන අඳුරු කොරිඩෝව දිගේ නොපෙනී යනවා සෙනෙවිතුමා බලා සිටියා...

හන් සෝයොන් සෙනෙවිතුමා රෑ කරුවලේම හොරෙන් මාලිගාවේ කොරිඩෝව දිගේ ඉස්සරහට ඇවිද්දේ වටපිට බලන ගමන්...ඔහුට කලින් ඉඳන්ම දැනුනා ඔහුගේ පසුපසින් කවුරුන් හෝ හඹා එන බව...

එකපාරටම පසුපසින් කවුරුහරි කතා කරනවා ඇහිලා සෙනෙවිතුමා ගැස්සිලා හැරිලා බැලුවා...

**"රජතුමනි !"**

**"ඔබ කුමක්ද මෙහි කරන්නේ මේ වෙලාවේ..."**

රජතුමා අසද්දී සෙනෙවිතුමා ඉක්මනට රජතුමාවත් ඇදගෙන ළඟ තිබුණු ශාලාවකට ගිහින් දොර වහගෙන රජතුමා දිහා බැලුවා...

**"රජතුමනි...ලොකු ප්‍රශ්නයක්..."**

**"කුමක්ද ?"**

සෙනෙවිතුමා ආයෙත් වට පිට බලන ගමන් රජතුමාගේ කන ළඟට ළන් වුණා...

**"පහුගිය දවසක මින් ආදී ආදිපාදිතුමාගේ කාමරයට**

**කැස්කස් රාජධානියේ රජතුමා ඇවිල්ලා ඉන්නවා මන් මගේ ඇස් දෙකටම දැක්කා..."**

සෙනෙවිතුමා පවසද්දී රජතුමා සෙනෙවිතුමා දෙස පුදුමයෙන් බැලුවා...

**"ඔබ සත්‍යක්ද පවසන්නේ..."**

**"එසේය රජතුමනි මා මගේ දෑස් දෙකෙන්ම දුටුවා"**

**"ඔවුන් කුමක් ගැනද කතා කරේ"**

**"මට හරියට ඇහුනේ නැහැ...නමුත්කැස්කස් රාජධානියේ රජතුමාට රජකම නෙවෙයි ඕනි...වෙන දෙයක් නමුත් ඒ කුමක්ද කියා මට ඇහුණෙ නැහැ...නමුත් ඔහු පැවසුවා ආදිපාදිවරයාට රජකම ගන්න ඔහු උදව් කරන්නෙ ඔහුට අවශ්‍ය දේ නිසා කියලා..."**

**“ඔහු කොහොමද මාලිගාව ඇතුලට පැමිනියේ “**

**“දන්නෙ නෑ”**

ඔබ දොරටු පරික්ෂා කරන්න ඔබගේ සොල්දාදුවෝ යොදවන්න ...ඇතුලට ආපු විදිහටම ඒ අය එළියට යන්න එපැයි...”

**“රජතුමනි තවත් දෙයක් තියෙනවා”**

**“මින් ආදිපාදවරයා මොකක් හරි හදවතක් ගැනත් කිව්වා “**

සෙනෙවිතුමා පවසද්දී රජු ඔහු දෙස හැරී බැලුවා...

**“හදවතක් “**

ලී වුන් රජු ඒ ගැන දැනගෙනයි හිටියේ... අනිත් කාටත් වඩා එයා එයාගෙම ගැහෙන හදවත ගැන දැනගෙන හිටියා...

සුදු මකර හදවතක් කියන්නේ මේ ලෝකෙ තියෙන බලසම්පන්නම දේවල් වලින් එකක්...

ඒ බලසම්පන්න දේට රජුත් උරුමකම් කිව්වා... ඒ වුණත් ඔහුගේ මව හා පියා රාජද්‍රෝහී විදියට මාලිගාවේ දී හිස ගසා දාලා මරපු දවසේ ඔහුගේ හදවත ගලවල දැම්මා...

සුදු මකරුන්ගේ නළලේ තිබුණු ධවල මැණික තමා එයාලගේ මකර හදවතේ ප්‍රතිබිම්බය උනේ...

මකරෙකුගේ ධවල මැණිකක් වෙන කෙනෙකුට අයිති වෙන තාක් කල් ඒ මකරාගේ හිත පාලනය කිරීමේ සීමිත බලයක් මැණිකේ අයිතිකාරයාට තියෙනවා...

සේයුන් කුමරියගේ පියා රජ වී සිටි කාලයේ ලී වුන් කුමරුගේ පවුලේ අය මරලා දාන්න රාජ අණ ක් දුන්නා...

මේ කාලයේදී කුමරුව හිරගෙට නියම වුණත් එයාව මරා දැමුවේ නෑ...

එයාගෙ ධවල මැණික රජතුමා ගත්තා...ඔහු මැතක් වෙනකන් හිතාගෙන සිටියේ එහෙම වුනත් එයාගෙ මැණික උදුරගෙන තිබ්බේ මින් ආදිපාදවරයා යි රජු ලවා ඔහුගේ දෙමව්පියන් මරා දැමීමට කටයුතු කර ලී වුන් කුමරුව ඔහුට ඕන විදිහට වැඩ ලබා ගැනීමට අධිපතිවරයාට අවශ්‍යා වී තිබිණි...

මින් අධිපතිවරයාට අවශ්‍යා සේ කුමරු කුඩා කල හැසිරුණත් වයසින් වැඩිවියට පත්වෙද්දී පාලනය කිරීමට නොහැකි තරම් බලයක් ශක්තියක් ලැබීම නිසා මින් අධිපතිවරයාට ඔහුව පාලනය කිරීමට නොහැකි වූවා...

එහෙම වුණත් රජුට තාමත් ඔහුට අවශ්‍යා විදියට වැඩ කරන්න බැරි වුනේ ඔහුගේ හදවත ඔහුට එකගව නොතිබූ නිසාය...

ඒ අතරේ ඔහුට තිබූ එකම ප්‍රශ්නය නම් ඔහුගේ හදවත තිබෙන්නේ මින් ආදිපාද තුමා ළඟ නම් ඔහුගේ ඇඟ ඇතුලෙ තියෙන ආදේශ හදවත කාගේද කියන එකයි...

රජතුමා ඔහුගේ කුටියේ සිටිද්දී  කවුරුන් හෝ දොරට තට්ටු කරන හඬ ඇසුණා...

“පැමිණෙන්න”

ඒ පැමිණ සිටියේ මකරුන් මෙහෙයවන මකර කණ්ඩායමේ පාලකයයි...

“අපි අද මාලිගාවෙන් එළියේ ගම් කීපයකටම ගියා...සමහරක් ගම් සම්පූර්ණයෙන්ම කොල්ල කාලා...උතුරු කඳුකරය වයින් ගබඩා සම්පූර්ණයෙන්ම කොල්ල කාලා...

හැම තැන පොඩි ළමයි වඩා ගත්තු කාන්තාවෝ ඉන්නවා “

“ඉතින් මකර සංචාරකයන්ට මේ ගැන කලින් පණිවුඩ ලැබුන් නැද්ද “

“අපි මේ ගැන දැනගෙන දවස් කීපයක් වෙනවා...මොනා උනත් මේ පොඩි සතුරු කණ්ඩායමක් නෙවෙයි...ඒ අය හැම තැනම ඉන්නවා..තත්ත්වය පාලනය කරන්න බැරිම තැන රජතුමාව මුණ ගැසීමට පැමිණියේ ...”

“ඒ කැස්කස් වල සොල්දාදුවො කැස්කස් වල රජතුමා මින් ආදිපාදවරයාට උදව් කරනවා...කැස්කස් වල මිනිස්සු ඇස්රුස් ඇතුලට ආවෙ කොහොමද කියලා මම දන්නෙ නෑ...හැබැයි එයාගෙ ලොකු සේනාවක් අගනුවරින් එළියේ ඉන්නවා

උන්ට කන්ඩ බොන්ඩ හොයාගන්න ඕන නිසා තමයි ගම් කොල්ල කනවා ඇත්තේ...ජේන විදිය ඇස්රුස් ඇතුලේ අගනුවරින් පිට අගලක් නැර හැමතැනම ඒ සේනාව කල්ලි ගැහිලා ඉන්නවා..."

දැන් දැන් මාලිගාව වටේට හැමවෙලේම මකරු කැරකුණා අගනුවරට හැම පැත්තෙන්ම එකතු වුණු මිනිස්සු නිසා අගනුවර ආරක්ෂාව කොහොමත් වැඩි කරලයි තිබුණේ...

මේ අතරේ සේයුන් කුමරිය ගැබිනියක් වී සිටීම නිසා ඇයගේ ආරක්ෂාව දහස් ගුණයකින් වැඩි කරලයි තිබුණේ.

ඇය විශේෂ අනතුරක් ගැන දැනන් හිටියේ නෑ. ඇයට කවුරුත් කිසිවක් පැවසුවේ නැත්තේ රජුගේ කීමටයි. මාලිගාවේ ඇතුලේ සාමකාමී පරිසරයක් පෙන්වීමට සැවොම උපරිම උත්සාහ කළා...

සේයුන් කුමරිය  උද්‍යානයේ හෙවන තියෙන ගහක් යට වාඩි වුණා. රජුගේ ප්‍රධාන ආරක්ෂකයාත් ඇවිත් සේයුන් කුමරියට ටිකක් එහායින් ඇවිත් වාඩි වුණා...

රජුගේ ප්‍රධාන ආරක්ෂාකයා ළඟදී ඉඳන් ඇයි ගේ වටේ වැඩිපුර කැරකෙනවා කියා දැනුනත් ඇය ඒ ගැන වැඩිය සිතන්නට ගියේ නෑ.

රජතුමා රජුගේ ප්‍රධාන ආරක්ෂක යත් සේයුන් කුමරියගේ වයසේ පසු වූ නිසා රජු ඔහුව ඇයගෙර් ආරක්ෂාවට යොදවලා යි තිබුණේ ...

රජුගේ කීමට කුමරියගේ ආරක්ෂාවට සිටි ඔහුට දැන් නම් එය හොඳටම එපා වී තිබුණි...කුමරියගේ තනියට හිටපු ඔහුගේ උගුරු දණ්ඩ මේ වෙනකොට කැඩිලා යි තිබුනේ..

"කුමරිය දුවන්න එපා..."

"කුමරිය සෙමින් ගමන් කරන්න..."

"කුමරිය ඔහේ යන්න එපා..."

"කුමරිය ඔය තරම් උස තැන් වලට නගින්න එපා...''

“කුමරිය නිදාගන්න...”

“කුමරිය හෙමිහිට අනුභව කරන්න...”

කුමරිය අරක කරන්න කුමරිය මේක කරන්න කිය කිය ඇයගේ පසුපසින් දුවා ඔහුට දැන් හොඳටම මහන්සි වී තිබුණේ ය.

ඒ වුණත් රජු හරි වෙන කවුරු හරි කුමරියට කිසිවක් පැවසුවොත් ඇයට තරහ යන්නේ ලෝදිය උඩ හිටගෙන ඉන්නවා වගේයි...

ඒ වෙලාවට ඇගේ මන්තර අහගෙන ඉන්න බැරි නිසා ලී වුන් කුමරු ඇයව තරහ ගැසුවේ නැතිම තරම්...

ඒ අතරේ

මින් ආදිපදිතුමා ජල තටාකය බැහැලා ඉන්නේ වෙලාවේ ඔහුගේ පැත්තකින් හිටගෙන සිටි හන් සෝයොන් සෙනෙවිතුමා දුටුවා ආදිපාදි තුමා ගේ කරපල්ලේ එල්ලෙන මාලේ...

සේවිකාවන් ආදිපාදවරයා ගේ  උරහිස් සම්බාහනය කරද්දි ඔහු සිටියේ ඇස් දෙක පියාගෙනය...

සෙනෙවිතුමා ආයෙම වතාවක් ඔහුගේ සාක්කුවට අත දාලා බැලුවේ ඔහු රැගෙන ආපු දේ තියෙනවද කියලයි..

සේවිකාවන් වැඩේට අවධානය දීලා සිටි නිසා සෙනෙවිතුමා ඔහු ළඟ තිබූ ගිනි කබලට කඩුවෙන් තට්ටුවක් දානවා සේවිකාවන් දුටුවේ නෑ...

ගිනි කබලේ තිබූ අඟුරු ජල තටාකයට වැටී ලොකු සද්දයක් ආ නිසා ආදිපාදවරයා බය වී හැරී බැලුවා...

අඟුරු වැටී තිබුණේ ඔහුගේ කකුල හරියට යි ඒ නිසා ඔහු තරහෙන් එළියට බැස්සේ සේවිකාවන්ට කෑගහන ගමන් ය...සේවිකාවන් හදිස්සියේ එළියට දිව්වේ අඟුරු සුද්ද කරලා දාන්න රෙදි කෑල්ලක් අරගෙන එමටය ...

ඒ අතරේ නැවතත් තටාකයට බහින ආදිපාදවරයා ගේ කකුල දිහාවට සෙනෙවිතුමා මේ තරම් වෙලා තියාගෙන සිටි හඳුන් කැල්ලකට පයින් ගහපු නිසා ඔහුව ලිස්සා ලෑලි බිමේ ඇදගෙන වැටුනා...

ඔහු පහලට වැටෙන වත් සමගම සෙනෙවිතුමා කඩු මීටෙන් ඔලුවට ගහපු නිසා ඔහු බිමට වැටුනේ සිහිසුන් වෙලායි...

සෙනෙවිතුමා ඉක්මනට දොර දිහා බලලා එයාගෙ සාක්කුවේ තිබුණු මාලයක් අරගෙන එය ආදිපාදවරයාගේ ගෙලෙහි පළඳා ඇත්ත මැණික හොරකම් කලා...

සේවිකාවන් එතැනට පැමිණ ආදිපාදවරයා වැටී සිටිනු දැක බිය වී කෑ ගැසුවා...

"ඉක්මනට ආදිපාදතුමා ඔහුගේ යහනට ගෙනියමු...

වෙදදුරු තුමාට කතා කරන්න..."

"ඔහුට කුමක් ද සිදුවූයේ"

"ඔහු ලිස්සා වැටුණ මට අල්ල ගන්නත් බැරි උනා හදිස්සියට..."

සෙනෙවිතුමා ආදිපාදතුමා ට සිහිය එනකන් එතනින් ගියේ වත් නැත්තේ ඔහුට සැක නොහිතෙන්න ඕනි නිසයි...

හිතුවා වගේම ආදිපාදතුමා සිහිය ආපු ගමන් හෙව්වේ මාලේ තියෙනවද කියලයි..

.ඒ වුණත් ඒ වන කොට වනකොට ඇත්තම ධවල මැණික තිබුණේ සෙනවිතුමාගේ සාක්කු වෙයි...

"මොකක් හරි ඔලුවෙ වැදුනා වගෙත් දැනුනා "

"ඔව් ඔබතුමාගේ ඔළුව බිත්තියේ එල්ලා තිබූ ඉටිපන්දම් රදවනයකත් වැදුනා..."

"තමුන් තමා ඔක්කොටම මුල...පිලිවෙලකට වැඩක් කරන්නේ නෑ රත්හඳුන් කැලි බිම දාන්න තරම් අසිහියෙන් ද වැඩ කරන්නේ හහ්...."

එසේ ඔහු සේවිකාවන්ට බැන වැදුනා...

"සමාවෙන්න ආදිපාද තුමනි..."

මේ අතරේ සෙනෙවිතුමා ආදිපාද තුමාගේ කාමරෙන් එලියට ඇවිත් ඉස්සරහට ගියේ ඔහුගේ අතේ තියෙන භාණ්ඩයත් සඟවාගෙනයි...

රජතුමා හැමතැනම ඇවිදින සෙනඟ අතරේ පැත්තක අශ්වයා පිට ඉඳගෙන සරණාගත කඳවුරු දිහා බලා සිටියා...

හුඟක් මිනිස්සු ඇවිත් රජතුමා ඉස්සරහ දෙකට නැවිලා සොල්දාදුවන් ගෙන් කන්න දෙයක් අරගෙන ගියේ රජතුමාටත් දීර්ඝායුෂ පතලා...

ඒ අතරේ රජ දැක්කා පැත්තක සද්දන්ත පිට්ටනියේ දිග ඇරිලා නිදාගෙන ඉන්න මකර සේනාව...

මේ දවස්වල මාලිගාවේ හැම සොල්දාදුවකුටම වගේ නිදහසක් තිබුනේ නැති තරම්...

රජු මකර දිහාට ඇදෙන වෙලේ ඔහු දුටුවා මකරු ඇස් ඇරලා ඔහු දෙස බලන ඔවුන්ගේ සද්දන්ත වලිග වන ආකාරය..

ඒ අතරේ ඔහු දුටුවා මකර සේන්පති ඔහු ළඟට එනවා

"ඔබට අද රෑ විශේෂ රාජකාරියක් තියෙනවා මා ආවේ ඒ ගැන පවසා යෑමටයි..."

"හඳවත තියෙන්නේ තියෙන්නෙ මං ළඟයි.."

මේක කල් දාන්න බෑ ඔබ අද රෑ  මාලිගාවට පැමිණෙන්න..ඒ අය කොයිවෙලේ කඩා පනීද කියලා අපි දන්නේ නෑනේ..

රජු පෙට්ටියක දමා තිබූ මැණිකක් එළියට ගෙන එය  සෙන්පති තුමා ගේ අතේ තැබුවා...

"එය ලඟට හුඟක් ලස්සනයි..."

එසේ පවසා ඔහු ඔහුගේ වැඩේ පටන් ගත්තා...

එයාගෙ අතේ  මොනවා හරි දිලිසෙන දෙයක් නිසා මැණික තව ටිකක් දිලිසෙන්න ගත්තා...ටික වෙලාවකින් ඔහුගේ අතේ තිබුනේ ගැහැන හදවතකි...

ඒකෙ මැදින් ගියපු රත්රන් පාට ලේ නහර නිසා ඒක ලස්සනට පෙනුනා... කිසිම සම්බන්ධතාවයක් නැති ලේ නහරයක් නැතුව ඒ හදවත තාලෙකට ගැහුනා...

රජු එකපාරටම ඔහුගේ හදවත ඇල්ලුවා ...

ඔහුට දැනුනා මුළු කාමරයම කුණාටුවකට ගහගෙන යනවා වගේ..ඔහු එකපාරටම කලන්තේ දාලා වැටුනා

ඔහු ඇහැරල බලද්දී ඔහුට දැනුනේ ඔහුව පාවෙනවා වගේ හිස අත ගගා වටපිට බලද්දී ඔහු සිටියේ මාලිගාව ඇතුලේ නෙවෙයි...

ඔහුට තේරුණා ඔහු සිටින්නේ හිර ගෙයක් ඇතුළේ කියලා

"මාව මේකෙන් එළියට ගන්නවා මමයි රජතුමා..."

ඔහු හයියෙන් කෑ ගහන ගමන් යකඩ කම්බිකූරු අල්ලගෙන ඉද්දී

එකපාරටම ඔහුට ඇහුණා ගැනු කෙනෙකුගේ කෑගැසීමක්...

ඔහු ඒ දෙස හැරී බලද්දී ඔහු දුටුවා  දැකලා පුරුදු ගැහැනිය ක්...

ඒ ගැනු කෙනාගේ පපුව මැදින් දෙකට පැලිලා ලේ ගලාගෙන යද්දි ඇයගේ කට දෙපැත්තෙන් ලේ බේරුනා...

ඊට එහා පැත්තෙන් හිටගෙන හිටියේ කවුද කියලා අඳුර ගන්න ඔහුට අමාරු වුණේ නෑ...

"ඇයගෙන් පැත්තකට වෙනවා..."

රජතුමා කම්බි කුරු අස්සෙන් අත  දාලා කෑගැහුවත් මින් ආදිපාදතුමා ට එය ඇහුන බවක් නම් පෙනුනේ නෑ...

" මැණියනී..."

ඔහු කෑ ගැසුවත් ඔහු කියූ කිසි දෙයක් එතැන සිටි කටවත් ඇසුණු බවක් නම් පෙනුනේ නෑ...

"තමුන් කරේ ලොකු වරදක් අර මනුස්සයා විවාහ කරගෙන කලේ..."

ආදිපාදතුමා පැත්තකට අත දික් කරලා කියද්දී පැත්තක වැටිලා ඉන්න මළකඳ දැක්කම ඔහුට හුස්ම ගන්න එකත් අමතක උනා...

"ඒ අයට පාඩුවේ ඉන්න දෙනවා"

"බලනවා මං තමුන්ගේ දරුවාට කරන්නේ මොකක්ද කියලා..."

ආදිපාද තුමා කියද්දී එ ලේ බේරෙන අත්දෙකින් ඔහුගේ කකුල අල්ලා වැඳ වැටුණා...

"මගේ දරුවාට මොනවත් කරන්න එපා..."

"එහෙනම් තමුන්ගෙ දරුවව මැරෙන්න නොදී තියාගන්න නෙ ඕනේ "

ඔහු එසේ පවසා ඇයගේ පැලී තිබූ පපුව අස්සට අත දා ඒ ලේ බේරෙන හදවත එළියට ඇදලා ගනිද්දී ඒ ඇහුන මරලතෝනියෙන් ලී වුන් කුමරුගේ  කන් පිරිලා ගියා ...

ඔහු දුටුව ආදිපාදවරයා ඔහුගේ දෙසට එනවා ඔහු ළඟට එද්දී ලී වුන් කුමරු පිටුපසින් පිටුපසට ගියත්

ආදිපාදවරයා ඔහුව දැක්කෙ නෑ...

ඔහුගේ පැත්තක එදා සිටි පොඩි පිරිමි ළමයෙක් ළඟටයි...ඔහු පිරිමි ලමයා  දෙස බලා

"මට මැණික අරන් දෙනවා "

ආදිපාදවරයා එසේ පවසද්දී මන්තර කාරයෙක් පිරිමි ළමයාගේ හදවතට උඩින් අත අරන් යද්දි

කලුපාට ගිනිදැල් මතු වුණා...

ඒ අතරේ ඒ කෙනා පොඩි පිරිමි ළමයාගේ රත්තරන් පාට හදවත එක් අතකින් අරගෙන අනිත් ලේ බේරෙන එයාගේ අම්මාගේ හදවත ඒ ඇඟ ඇතුලට දැම්මා ...

එකපාරටම ඇහුන මරලතෝනිය නිසා අත් දෙකෙන් කන් දෙක වසාගෙන කුමරු කන් දෙක වසා ගත්තේ කම්මුල් දිගේ කඳුළු බේරද්දීයි...

ඔහු හයියෙන් හුස්ම ගන්න ගමන් ඇස් දෙක ඇරල බලද්දි... ඔහු සිටියෙන් මාලිගාව ඇතුළෙමයි...

සෙන්පතිතුමා ඔහු දෙස බලද්දී රජතුමා කෙලින් වාඩි උනෙ කම්මුල් දිගේ ගලන කඳුළු පිස දාන අතරතුර මයි...

"රජතුමනි ඒතරම් වෙලානෑ ...

සෙන්පති තුමා එසෙ පවසා රජුගෙ ලගට විත් රජුගෙ පපුව මැදින් ඇගිල්ලෙන් ඉරක් ඇන්ද නිසා කලුපාට ගිනි දැල් රජුගෙ පපුව වටේ එතිලා කුහරයක් හැදුනා .. "

"එපා ඕක කරන්න එපා..."

ඔහු එසේ කෑ ගසද්දි සෙන්පතිතුමා ඔහු ලගට පැමිනියා ඔහුගේ අතේ තිබූ හදවත එය රතුපාට හදවත ක්ෂණයෙන් අලුවී හුලගට පාවෙලා ගියා .

" මැණියනී..... "

රජු හයියෙන් කෑ ගහලා හඩන අතරේ ඔහුගෙ බල සම්පන්න හදවත ඔහුට බද්ද උනා.....

ඔහුව සම්පූර්ණයෙන්ම කලු ගිනි දැන් මැද්දෙන් වහගනිද්දි ඔහුට දැනුනේ ඔහුගේ හදවත දෙකට මැදින් පැලිගියා වගේ . ඉන් පසු ඒ කලු ගිනිදැල් ටික ටික අතුරුදහන් වුනා .

" ඇයි ඔබ එසෙ කලේ...

ඒ මගේ මැණියගේ හදවත ...

මා පවසද්දිත් ඇයි ඔබ එසෙ කලේ ... "

රජු පැවසුවේ හඩා වැලෙපෙන ගමිනි ." එ හැමදේම වී අවසානයි . ඔබට එ දේවල වෙනස් කරන්න බෑ. අනාගතයේ නැවත එවැනි දෙයක් සිදු නොවීමට ඔබ ශක්තිමත් වෙන්න ඔනි ..."

"ඔබ මට බොරු කියනවා කියලයි සිතෙන්නෙ ..."

"ඇයි ඒ ..."

"ඔබ දැන් මාත් එක්ක නෙමෙ ඉන්නෙ ..."

රජුට දැන් සෙයුන් කුමරිය පසු පසම සිටීමට වෙලාවක් තිබුණේ නෑ ...

එ උනත් සෙයුන් කුමරිය කිසිවක් නොදන්නෑ නිසා ඇයට පැහැදිලි කිරිමට හැකියාවක් තිබුනේ නෑ .

" මේ දවස් ටිකේ මට වැඩ රාජකාරි වැඩි එකයි ..."

රජු පැවසුවේ සෙයුන් කුමරියගෙ හිත හැදීමටය ...

රජු මාලිගාවෙන් එලියේ සොල්දාදුවන්ගේ පුහුනුවීම් කටයුතුවලටයි , ඇස්රූස් වල තැන් තැන් වල සිදු උනු යුද කටයුතු නිසා හුගක් ඔහු කාර්යබහුල වෙලා හිටියත් සෙයුන් කුමරිය මේගැන දැනගෙන සිටියෙ නෑ ...

ඇයට මේ දේවල් ගැන පවසා බොරුවට බය ගැන්වීමට රජුට කිසි සේත්ම උවමනාවක් තිබුනේ නෑ ...

"ඇය මේ දවස්වල ඇස්රූස් වල මකරු කැරකෙන්නෙ ..."

"මේ දවස්වල ඇස්රූස් වල අල්ල ගන්න බැරි මන්කොල්ල කන්ඩායමක් ඉන්නවා ..." ඒ අය අල්ලගන්න තමා

අගනුවර ටිකක් ආරක්ෂාව වැඩි කලේ..."

" ආ ඒක තමා මම සිතුවේ ඔබ මට ලොකු දෙයක් සඟවනවා කියාලා..."

කැස්කස් රජතුමා කූඩාරම ඇතුළේ එහාට මෙහාට ගියේ ඔහුගේ ඔලුව ගිනි අරන් තියෙන අතර තුරේ . මේ අතරතුර නෑ ඉතින් එන්න මින්නාදිපාදි තුමා ඇතින් එන විට දුටු විට ඔහුගේ කෝපය තවත් ආරූඩ වුනා ...

"මේක හරිය යන්නෙ නෑ ... ඌ තවත් ශක්තිමත් වෙනවා විතරයි ... මාලිගාවේ ආරක්ශාව තවත් වැඩිකරලයි තියෙන්නෙ ..."

කැස්කස් රාජධානියේ රජු කෝපයෙන් කෑ ගහද්දි මින් ආදිපාදි තුමා ඇවිත් පැත්තකින් වාඩි උනා .

“ ඒක තමා මාත් කලින් ඉදන් පැවසුවේ මෙහෙම වටෙන් ගොඩෙන් පහර දෙන්න බෑ ...”

“ තමුන් කලින් ඉදනම් කීවේ ඕක තමුන්මයි මට කීවේ ටිකක් ඉවසලා ලේසි ක්‍රමයකින් යමු කියලා...”

එ විදියට කැස්කස් රාජදානියේ රහු කෑ ගහද්දි ඇතුලට ආපු කෙනෙක් හෙමිට උගුර පෑදුවා

“ රජතුමනි ...”

“කුමකද පැවසීමට ඇත්තේ ඉකමනින් පවසා පිටව යන්න ...”

“ ඔවුන් මුහුදු කෙලවරේ සිටි අපේ සේනාව විනාශ කරලා ...

මෙහෙම ගියොත් අපගේ කැලෑවල සිටින සේනාවක් ඔවුන් විනාශ කර දමයි ...”

සොල්දාදුවා එසෙ පවසද්දි කැස්කස් රාජදානියේ රජුට කෝපය පාලනය කරගැනීමට නොහැකිව ලග තිබූ මේසය උස්සා පොලවේ ගැසුවා .

“ මම කලින්ම පැවසුවා අපි කල් වැඩි කියලා ...හැමදේම විනාශ වෙනවා මීට වඩා කල් ගත්තොත් ...”

ඔහු එසෙ පවසා කූඩාරමෙන් පිටව යද්දි මින්නාදි පාදිතුමත් ඔහු පස්සෙන් ඇදුනා හැමතැනම හිටපු කොලපාට කබා ඇදගත්තු සොල්දාදුවන් පිලිවෙලට රජු ඉදිරියේ පෙලගැසුනා ...

“අපි කෙලින්ම මාලිගාවට පහර දෙනවා...හැම තැනටම පණිවුඩ අරින්න ...ආයුධ සූදානම් කරන්න ... වෘක රැළ වල් කූඩු වලින් නිදහස් කරන්න ඇත්තම යුද්ධයට සූදානම් වෙන්න .

කැස්කස් රාජධානියේ රජු පවසද්දී ඔහුගේ සේනාව ජයඝෝෂා නැගුවේ කඩු පොරෝ අහසට දික් කරමිනි.

“ ඔබ සිතන තරම් ලේසියෙන් මේක කරන්න බැහැ මකරුන්ට මොකද කරන්නේ...? “

මින් ආදිපාදිතුමා කැස්කස් රාජදානියේ රජුගෙන් විමසුවේ කුතුහලයෙනි.

“  ගෝර්ගන් සත්තු මුදාහරිමු ... නැතත් මගේ සොල්දාදුවන් ලග තියෙන ආයුධ මුවහත්...

එක නිසා බය වෙන්න දෙයක් නෑ එවට එක මකරෙක් නෙමෙ මකරු දහයක් උනත් මරා දමන්න පුලුවන් ...මින් ආදිපදි තුමා තරහෙන් කැස්කස් රජු දිහා බැලුවා ...

එ කුලුහරක් නෙමෙ ...මකරු ...මම කිව්ව විදියට සැලැස්ම විදිහට තව ටික කාලයක් ඉවසමු මාලිගාවට පහර දුන්නොත් මාලිගාවත් විනාශ වෙයි ...

මින් ආදිපාදතුමා පවසද්දී කැස්කස් රාජධානියේ රජු ඔහුගේ බෙල්ලෙන් අල්ල ගත්තෙ තදින් මිරිකල යි...

“තමුන් කියන විදිහට තවත් ඉවසුවොත්  මම පැරදෙනවා...මට පරාජය බාරගන්න ඕනෙ නෑ ...මට ඇස්රුස් වලට වඩා සේයුන් කුමරිය ව වටිනවා...මම ඉක්මනට ඇයව මගේ කරගන්නවා...තමුන්ට මම කියන දේ තේරෙන...?කැස්කස් රාජධානියේ රජතුමා තරහට කෑගහද්දී ඔහුගේ අත්වල නහර තරහටම ඉදිමුණා ..

.”තමුන් මං කියන විදිහට වැඩේ කරනවා  “ කැස්කස් රාජදානියේ රජු මින් ආදීපාදි තුමාගේ බෙල්ලෙන් අතඇරලා ඔහුව පිටුපසට තල්ලු කලා . ආදිපාදි තුමා ඔහුගේ හුස්ම පොද අල්ල ගන්න දගල දගල ඇස් කොනින් ඔහු දිහා බැලුවා .

“ කුමක්ද ...?”

“ අගනුවරට කරලා තියෙන ආරක්ශාව බිදිනවා ... මන් එතනින් එහාට වැඩටික බලාගන්නම් ...”

කැස්කස් රාජදානියේ රජු පවසද්දී මින් ආදිපාදි තුමාගේ කෝපය ඇවිස්සුනා එ වුනත් එයාගෙන් උදව් ඉල්ලනවා ඇරෙන්න වෙන කරන්න දේකුත් නැති නිසා රතුවෙලා ඉදිමිලා තියෙන බෙල්ල අල්ලගෙන කූඩාරමෙන් එලියට ඇවිත් අශ්වයාගේ පිටට නැන්ගා .

ලී වුන් රජු වයින් වීදුරුවක්  හිස්  කරන අතරේ එක පාරටම ඇහුන සද්දයක් නිසා ජනෙල් කවුලුවෙන් එලිය බැලුවේ හුස්මගන්න එකත් නතර වෙද්දි ...

මකරෙක් මල ලතොනි දීලා කෑ ගහන සද්දෙ ඇහෙද්දි රජු සදලු තලයට දිව ගියා

“ මගේ මකරෙක්.. මගේ මකරෙක්ට මොනවා හරි උණා....”

අග නුවරින් ඈත කෙලවරේ ඇතිවෙලා තිබුන ලොකු ගින්නක් ඔහු දුටුවා එ අතරේ මාලිගාවේ තාප්පෙ ලගින් ලොකු පිපුරුමක් වෙනවා දකිද්දි රජු ආපසු හැරි යහන දෙසට ඇදී ගියා...

එ වෙනකොට සෙයුන් කුමරිය යහනේ ඉදගෙනයි හිටියේ. ඇයගෙ බයවී තිබෙන මුහුන දුටු විට රජුට ඇයගෙ සිත සැදීමට වෙලාවක් තිබුනේ නෑ . ඔහු ඉකමනින් ඇයගෙ වටා සලුවක් ඔතා ඇයව නැගිට්ටවද්දි එක පාරටම කුටියේ දොර විවෘත වන ශබ්දය ඇසුණි.

“ඉක්මන් කරන්න...”

රජුගේ ප්‍රධාන ආරක්ෂකයා කෑ ගසද්දී

සේ යුන් කුමරිය වත් රැගෙන කොරිඩෝව දිගේ ඉස්සරහට ඇදුනා ...

“ඒ පැත්තෙන් බෑ ...අනිත් පැත්තෙන් යමු .. ඉක්මන් කරන්න “

ප්‍රධාන ආරක්ෂකයා එසේ පවසද්දී රජු කුමරිය වත් රැගෙන කොරිඩෝවේ අනිත් කෙලවරට දුවන් ගියා ....ඒ අයට සෑහෙන වේගයෙන් දුවන්න පුළුවන් කමක් තිබුණේ නෑ ...සේයුන් කුමරිය ගැබිනියක් නිසා කකුලක් තියලා කකුලක් තිබ්බෙත් අමාරුවෙන් නිසා දුවල බේරෙන්න බැරි බව තේරුණා ....

ඒ අතරේ එයාලා ගියපු පාරේ ඉස්සරහා ආක්‍රමණිකයන් පිරෙනවා දැක්කම රජු නැවතී ආරක්ෂකයා දෙස බැලුවා...

“ඔබල ඔය පැත්තෙන් යන්න ...මම මේ අය ගැන බලාගන්නම්... මැයව මාලිගාවෙන් ආරක්ෂිත තැනකට රැගෙන යන්න ...”

“මට බෑ මටබෑ ඔබ නැතුව මෙතැනින් යන්න ..කුමක්ද මේ සිදුවන්නේ “

සෙයුන් කුමරිය බියවී අහනවත් සමග ඇයගේ කකුල් වෙවුලා බිමට ඇදගෙන වැටෙන්න යනවාත් සමඟ ආරක්ෂකයා ඇයව අල්ලා ගෙන හරහා ට වඩා ගත්තා...

රජතුමා අතේ සටන් කිරීමට ආයුධ තිබුනෙත් නෑ ...

“මම කිසිවක් සිදු කරන්නේ නෑ...මාව මින් ආදිපාදවරයා ළඟට රැගෙන යනවා...”

රජු කෑගසා පවසනවා ඒ මිනිසුන්ට ඇහුණා...එතනින් ඉස්සරහට ආපු කෙනෙක් රජුගේ දෑතට යදම් දමා රැගෙන ගියා...ඔහු කොරිඩෝ ගණනක් පසු කරගෙන ඉස්සරහට යද්දි ඔහු දුටුවා මාළිගාව පුරා මරා දමා තිබෙන සේවිකාවන් ...

තවත් සමහර තැන් වල මාලිගාවේ තාප්ප බිඳ දමා මාලිගාව විනාශ කරලා දාලා තිබුණා...

හැමතැනම ආරංචි ගියා ඇස්රූස් වල රජතුමා යටත් වුන බව ...

රජුව එක්කරගෙන ගියේ එළිමහනේ තිබූ සද්දන්ත උද්‍යානයකට ය...ඔහුව එක්කරගෙන මින් ආදිපාදතුමා ලගට යද්දි ඔහු වටපිට බැලුවා ...

තාම හරියට යුද්දෙ පටන් ගත්තෙ වත් නෑ...ඒ නිසා ඇස්රූස් වල සොල්දාදුවෝ සිටියේ තරහින්...ඒ අය රජතුමාට දන්වැල් දාගෙන ගෙනියනවා දැක්කම කුලප්පු වෙන විදිය දැකල විදිය දැකල

රජු ඒ අය දිහාවට හැරිලා අතින් ඉගි කරපු නිසා සොල්දාදුවෝ කලබල නොකර වටේට රැස් වෙලා සිටියේ වෙන්න යන්නේ කුමක්ද කුමක් ද කියා සිතා ගැනීමට නොහැකි වයි...

රජු මේ තරම් ඉක්මනට සටන පාවා නොදෙන බව හැමෝම දැනගෙන හිටියා ...මොකද ඔවුන් මේ සටනට සෑහෙන කාලයක ඉඳන් සූදානම් වූ නිසා යි...

ඒ නිසා හැමෝම රජතුමා දිහා නිශ්ශබ්දව බලා සිටියේ කඩු කිනිසි අමෝරාගෙනයි ....

ඒ අතරේ මේ තරම් වෙලා එහාටයි මෙහාටයි පියාඹමින් ගෝර්ගන් සත්තු එලවීම ට මහන්සි වූ මකරුන් සොල්දාදුවන්ට පසුපසින් පෝලිමට ගොඩ බෑවා ලී වුන් රජුගේ පස්සහින් දැවැන්ත සේනාවක් සිටියා...

කැස්කස් රාජදානියේ රජතුමාගේ සොල්දාදුවන්ට පිටුපසින් ගොඩ බාලා සිටියේ ගෝර්ගන් සත්තුයි

“තමුන්ට මොනාද මාත් එක්ක කතා කරන්න තියෙන්නේ “

“මම තමුන්ලගේ කාලේ කන්නයි ආවේ “

රජතුමා එසේ පැවසුවේ දම්වැල් දිහා බලා මින් ආදිපාදතුමා දෙස බලන ගමන් ...මේ වෙනකොට ආරක්ෂකයෝ සේයුන් කුමරිය රැගෙන මාළිගාවෙන් එළියට පිට වෙන්නට ඇතැයි ලී වුන් රජු අනුමාන කළා...

ඔහුට අවශ්‍ය වූයේ ආක්‍රමණිකයන්ගේ අවධානය ටික වෙලාවකට වෙනත් අතකට හැරවීම ට පමණයි...

“තමුන් ඒ අය වගේමයි...”

ආදිපාදතුමා රජුගේ ළඟට කිට්ටු වී නිකටෙන් තද කර අල්ලාගෙන කියද්දී රජු ඔළුව ගසා දාලා ඒ දිරච්ච කය දිහා බැලුවේ තරහෙන් ගිනි ගන්න ඇස් දෙකෙන්

“තමුන්ට සිදුවෙන්නෙත් ඒ දෙදෙනාට වූ දේමයි..ඊටත් වඩා සතුටු හි

හිතෙන දේ තමා මම ඔබගේ කුමරිය තාම දැක්කේ නෑ.”

“හහ්...කියනකොටම ඇයත් එනවා...”

රජතුමා කොහෙද සිටින්නේ මට ඔහු සිටින තැනට ය යාමට අවශ්‍ය යයි

සේයුන් කුමරිය එසේ පවසා කෑ ගසද්දී ආරක්ෂකයන් වටපිට බැලුවේ බියෙනි...

“අපි යන්න ඕනේ කුමරියනි ඔහු පරිස්සමින් ඉන්නවා මේ වෙනකොට ඔබතුමිය මාලිගාවෙන් එළියට ගිහිල්ලත් ඉන්න ඕනේ “

“ඔහුගේ මහන්සිය වතුරෙ දාන්න එපා දරුවා ගැන හිතලවත් අපි යමු..”

ආරක්ෂකයෙක් එසේ පවසද්දී මාලිගාවට උඩින් පියාඹමු මකරෙක් ජනෙල් කවුළුව ලඟින් යනවා දැකලා ඇය ජනෙල් කවුළුවෙන් පහල බැලුවා...ඇය දුටුවේ සෙනඟ ගොඩක් මැද දම්වැල් දාලා රැගෙන යන රජුයි...

කුමරිය ආරක්ෂක ආරක්ෂකයන් පැත්තකට තල්ලු කරන ගමන් දොර පියනක් තරම් විශාල කවුළුවෙන් එළියට බැස තණ පිට්ටනිය දිගේ ඉස්සරහට ඇදුනේ ඇයගේ කැක්කුම් අල්ලන දරු ගැබත් අල්ලාගෙනයි...

“ඔබ විතරයි අඩුවට හිටියේ...”

ආදිපාදතුමා කියද්දී රජතුමා දම්වැල් ගලවා ගැනීමට සැරසෙනවා දුටු සොල්දාදුවෝ දෙන්නෙල් රජුව දෙපැත්තෙන් අල්ලා ගත්තා...

“ඇයට යන්න දෙනවා...”

“එහෙම කලොත් තමුසේ වගේම අර කුසේ ඉන්න දරුවත් මට දවසක වදයක් වෙනවා...”

මින් ආදිපාදතුමා එහෙම කියද්දි ඔවුන්ට ඇසුණා තවත් කෙනෙක් හයියෙන් මින් අධිපතිතුමාගේ ඔළුවට ගහනවා...

“ඇයට කරදරයක් කරන්න එපා...’

කැස්කස් රාජධානියේ රජතුමා එහෙම කියද්දී ඇස්රූස් රාජධානියේ රජු ඔහු දෙස බැලුවා...

“තමුන් තාමත් මහ මෝඩයෙක් “

සේයුන් කුමරිය හයියෙන් කෑ ගහද්දි ආදිපාදතුමා හැරිලා ඇය දෙස බැලුවා ...

කුමරිය ලී වුන් රජු දෙසට විත් ඔහුව තද කරලා අල්ලගෙන හිටපු සොල්දාදුවාගේ කඩු කොපුවේ තිබුණු කඩුව ඇදලා අරගෙන ඉස්සරහට දික් කරා...

ඇය එක පාරටම එසේ දෙයක් කරයි කියලා ආදිපාදවරයා සිතුවේ නැති නිසා ඔහුට සෙලවීමටවත් නො හැකි වුණා ...

රජුට ඉස්සරහින් හිටගෙන හිටපු කුමරියගේ අතේ තිබුණු කඩුවේ කෙලවර උනේ මින් ආදිපාද තුමාගේ බෙල්ල ලගින්...

“තමුන් හැමදාම අමතක කරා මට පිටුපසින් හිටගෙන ඉන්න කෙනා ඇත්තටම මොන වගේ කෙනෙක්ද කියලා ...”

ඇය එසේ කෑ ගසද්දී මින් ආදිපාදතුමා ට පිටුපසින් හිටගෙන හිටපු සොල්දාදුවෝ ඒ අයගේ කඩු ඉස්සරහට අමෝරාච්චා...

ඒ වුණත් ඇය අඩියක්වත් හෙළ වුණේ නෑ...ඇය අධිපතිතුමාගේ ඇස් දිහා කෙලින් බලාගෙන හිටියේ ඇහිපිල්ලමක් වත් නොගසායි...

ඒ වුණත් ඇය දෙසට දාහක් කඩු එසවෙනවා දැක්ක රජුගේ ඇස් වල නිල්පාට රටා මැවුණා...

ආදිපාදතුමා ට සේයුන් කුමරිය ට පිටුපසින් මැවෙන ඒ සද්දන්ත මකර ස්වරූපය දැක්කම සිහියක් පතක් නැතුව ගියා...

**"මගෙ මාලේ..."**

ආදිපාදතුමා එසේ පවසා ඔහුගේ ගෙලේ එල්ලුන මාල ඇල්ලුවත් ඔහු දුටුවා මකරාගේ පපුව ළඟින් කුහරයක් මතුවෙනවා ...ඒ කුහරේ ඇතුලෙන් ගැහුන රත්තරන් හදවත ආදිපාදතුමා හොඳට දැක්කත් ක්ෂණයෙන් කුහරය වැහිල ගියා...

ලී වුන් රජු ඔහුගේ සද්දන්ත මකර ස්වරූපෙට එද්දී ඔහුගේ වලිගය වැදි මාලිගාවේ එක් කොනක රුදෙව්වා නිසා.. ඒ බිත්ති ඉරි තැලී ගියා...මකරාගේ සද්දන්ත උල් කොඳු ඇට කොඳුනාරටිය දිගේ මතු වෙද්දි ඒ මකර ඇස් සද්දන්ත විදිහට පෙනුනා...

සුදු පාට මකරා හයියෙන් කෑ ගහද්දි ඒ හුළං පාරට ආදිපාදතුමාට දැනුනේ ඔහු පිටි පස්සට විසිවෙනවා වගේ යි.

ඒ වුණත් සෙයුන් කුමරිය ඔහුගේ බෙල්ලට කඩුව දික් කරගෙන මකරා ඉස්සරහ හිටගෙන හිටියෙ ස්මාරකයක් හා අසමසම වය...

මකරා ඉස්සරහට ගිනි දැල් පිඹිද්දී ඒ ගිනිදැල් වලින් මින් ආදිපාදතුමා ට පිටුපසින් සිටි සේනාවෙන් බාගයක්ම පිච්චුණා...

ඇස්රූස් වල

සොල්දාදුවෝ කෑගහගෙන කඩු කිනිසි අමෝරාගෙන ඉස්සරහට දුවද්දී රජුගේ මකර සේනාවත් යුද පිටියට පිවිසුණා...

ඒ අතරේ කෙනෙක් කුමරියගෙ අතේ ඇඳලා යුද පිටියෙන් අරගෙන ගියා ...

"සද්ද නැතුව එන්න..."

“ඇයගේ පස්සෙන් පන්නවලා ...කොහොමහරි අල්ලගන්නවලා...”

කැස්කස් රාජදානියේ රජු  එයාගෙ සේනාධිපතිට කෑ ගැහුවේ ඇස්රුස් වල සොල්දාදුවෙක් ගේ ඔලුව මැදින් කඩු යවන ගමන්...

සේයුන් කුමරිය  කැලෑව පාලු කරගෙන ආවේ ලොකු පාළු තණ පිට්ටනිය මැදට

ඇය බලාගෙන ඉද්දිම රජුගේ ආරක්ෂකයා සද්ධන්ත රතුපාට මකරෙක් උනා....ඒ සද්දන්ත මකරා රතු තටු දිගාරින ගමන් වටයක් කැරකිලා කුමරිය ළඟට ඇවිත් පාත් වී බෙල්ල දික් කලෙ පිට උඩට නගින්න කියන ගමන්...

ඒ වුනත් ඇයට පැනලා යන්න වුවමනාවක් තිබුණේ නෑ...ඇය රතු පාට මකරා දිහා බලලා ආයෙත් අනිත් පැත්ත හැරිලා බලද්දි  බය වෙලා ගියේ එයාට පිටුපසින් ඊටත් වඩා සද්දන්ත කළුපාට මකරෙක් තටු ගහනවා දැකලයි...

“මට යන්න බෑ..මට ඔහුව දාලා යන්න බෑ...”

ඇය කලු මකරා දිහා බලලා කෑගහද්දි ඒ ඇස්වල කඳුළු පිරුණා...

 ඒ වුණත් ඒ අහසේ තටු ගහන ගමන් සේයුන්  කුමරිය දිහා බලාගෙන හිටපු කළු මකරා තරහින් කෑ ගැහුවේ පළාතම දෙදරුම් කද්දී...

ඇය ඉස්සරහම එතරම් තරහින් කවදාවත් මකරෙක් කෑගහලා තිබුණේ නැහැ..ඒක දැක්කම බයට කුමරිය තව ටිකක් හයියෙන් ඇඩුවා...

රතු මකර අනිත් මකරා දිය හාවාට තරහෙන් සද්දයක් දාලා කෑගහන ගමන් කුමරියේ ළඟට ළංවෙලා කුමරියගේ මූනේ බෙල්ල අතුල්ලපු නිසා  ඇය කලු මකරා දිහා බලාගෙනම රතු රතු මකරාගේ පිට උඩට නැගලා තදකරලා අල්ලගත්තා...

මකරා ඇයවත් පිට උඩ තියාගෙන  යන ගමන් හුලං කපාගෙන මාලිගාවෙන් ඈතට පියාඹද්දී ඇය  හැරිලා බැලුවා ...

කැලෑවේ ලඟින් පෙනුණු ගිනි දැලුයි මාලිගාවටත් වඩා සද්දන්ත සුදු ගිනි පිඹින මකරවයි පැය ලාවට වගේ මීදුම අස්සෙන් දුටුවා ...

ඒ වුණත් රතුපාට මකරගෙ පිටේ යන එක ටික වෙලාවකින් ඇයට අමාරු වුණේ ඇගේ බඩ වේදනාවෙන් ඇඳුම් කන්න ගද්දියී..මකරා හොඳටම බය වුණේ ඇය හුගක් උස අහසෙ ඉඳලා පහළට වැටෙයි කියලායි...

ඒ වුණත් ඒ අයට පසුපසින් ගෝර්ගන් සත්තුන්ගේ පිටවල් උඩ නැගගෙන එන කැස්කස් රාජදානියේ සොල්දාදුවො ජේන්න හිටපු නිසාරතු මකරා පහලින් ගොඩබෑවේ කැලෑවක් මැදට වෙන්න වහන් වෙලා...

අමාරුවෙන් මකරාගෙන් ගෙනිමට බැහැ ගත්තු කුමරිය තණ පිට්ටනිය දිවේ පස්සෙන් පස්සට ගියේ රතු මකරා දිහා බලාගෙනමයි....

ඇයි එකපාරටම බිමින් වාඩි වුනේ හයියෙන් කෑ ගහලා කකුල් දෙක ඇත් කරන ගමන් ...

ඒ වුණත් රතු රතුමකරා දැක්කා ඒ අයව වටකර ගන්න කැස්කස් රාජදානියේ සොල්දාදු වන්ව...ඒ නිසා මකරාගේ සද්දන්ත තටු දිග ඇරලා සේයුන් කුමරියව වහගනිද්දී ඇයට දැනුනේ සද්දන්ත කාමරයක හිර වුණා වගේ ...

හැම පැත්තෙන් ම කැස්කස් සොල්දාදුව මකරාගේ ඇඟට හෙළි වලින් දුණු වලින් පහර දුන්නත් මකරාට ලේ එන තරම් තුවාලයක් වුණේ නෑ...මකරාට දැනුනේ ඉදිකටු වලින් අනිනවා වගේ පොඩි වේදනාවක් විතරයි...

සමහර සොල්දාදුව මකරගෙ ඇඟට නගින්න හැදුවත් මකරා හතර වටේට ගිනි කියලා විනාස කරපු නිසා හුඟක් අය අමු අමුවෙන් පිච්චුනා...

'උදව් කරන්න ...රිදෙනවා අහ්හ්හ්....."

කුමරිය හයියෙන් කෑගහලා උදව් ඉල්ලුවා ත් මකරට ඇයට උදව් කරන්න මේ අවස්ථාවේ හැටියට පුළුවන් කමක් වත් නෑ කියලා දෙදෙනාම දැනගෙන හිටියා...

ඇයට මේ තරම් කාලෙකට එයා විඳලා තිබුණු හැම වේදනාවක් ම බාරදෙන විදිහේ වේදනාවක් දැනුනා...

මේ අතරේ මකරට කැරකිලා දඟලලා පහර දෙන්න බැරි උනේ

එකම විදිහට ගුලිවෙලා තටුවලින් කුමරියෝ වහගෙන හිටපු නිසයි...ඒ නිසා පිටුපසින් වලිගය දිගය එයාගේ පිටට නගින හුඟක් සොල්දාදුවන්ට ගිනි පිඹින්න බැරිවුනේ වලිගය කොයිතරම් වැනුවත් කඩු පහරවල් නිසා වලිගය හොඳටම තුවාල වෙලයි තිබුනෙ ...

පුළුවන් තරම් උත්සාහ කරලා කෑගහලා කුමරියව ආරක්ෂා කරන්න හිටියා...

ඒ අතරේ එකපාරටම ඔහුට හුනා තවත් මකරෙක් කටු ගහන සද්දෙ...රතු මකරා උඩ බලද්දී දැක්කා කලුපාට මකරා වටේටම ගිනි පිඹින ගමන් රතු මකරාගේ එහා පැත්තේ හිටපු ගෝර්ගන් සත්තුයි සොල්දාදුවෝයි විනාස කරනවා...

සැහෙන වෙලාවක් යනකම් ඒ අය ගින්දරත් එක්ක සෙල්ලම් කරන වෙලේ සේයුන් කුමරිය සිටියේ ජීවිතයත් මරණයත් අතර සටනක..

එක වෙලාවකට කැක්කුම අල්ලලා ආයෙ කැක්කුමත් අතුරුදහන් වෙද්දි ඇයගේ කෝපයත් ඇවිස්සුණා...

ඒ වුනත් එයාට අත් උදව් දෙන්න වත් එයාගෙ දාඩිය පිහන්න වත් හිත හදන්න ළඟට වෙලා අත අල්ලගෙන ඉන්න කවුරුවත් හිටියේ නෑ ...

සේයුන් කුමරිය ඇගේ රතු මකරගෙ කකුලට හේත්තු කරගෙන හිටපු නිසා මකරාට හෙල්ලෙන්නවත් බැරි වුණා...

හුඟක් ආක්‍රමණික සොල්දාදුවෝ මකරු දෙන්නගෙන් බේරෙන්න තිබුන උවමනාවට කැලෑවට පැනලා ගිහින් අතුරුදහන් වෙලා ගියේ ජීවිතේ බේරගන්න බේරගන්න තිබුණු වුවමනාවට

...

මකරු දෙන්නට ඇහුණා කුමරිය හයියෙන් කෑගහලා අඬණ සද්දෙ...නමුත් ඒ දෙන්නගෙන් එක්කෙනෙක්වත් මනුස්ස ස්වරූපයට ආවේ නැත්තේ ඉදිරියේදී ඇතිවන අනතුරකට ලෑස්ති පිට ඉන්න ඕන නිසයි...

ඒ අතරේ පාන්දර වෙන වෙලාවේ ඇයට දැනුනා අන්තිම මොහොත ළඟ බව...ඇය ඇගේම සලුවේ කොනක් ඉරලා බිමින් එලුවා...

ඒත් එක්කම දරුවා මේ ලෝකෙට ආවා කියලා ඇයට තේරුනේ හයියෙන් ඇහුන සිහින්තෙක් ගේ අඩන සද්දෙ නිසා...

කලු මකරා එකපාරටම ඔලුව උස්සලා අනිත් මකරා දිහා බැලුවේ කුමරිය හොඳින් ද කියා දැනගැනීමටයි ඒත් සමගම...

“පිරිමි දරුවෙක් ....”

ඇය පිරිමි දරුවෙක් කියා කෑගැසුවේ දැනුණු සතුටටයි...

ඇය හොරා පහකට වඩා උත්සාහ කරලා තනියමමයි දරුවා බිහි කළේ...අලුත් වැදෑමහෙන් එළියට ආපු දරුවව ඔතන්න ඇය ළඟ සැපපහසු සිනිඳු සළු තිබුනෙ නෑ...

රජතුමා දරුවා ගැන ගොඩක් බලාපොරොත්තු තියාගෙන හිටියා...සේයුන් කුමරිය සමග හැම හැමවෙලේම ළඟ ඉන්නම් කියලා පොරොන්දු වුණා...

නමුත් ඔහු දැන සිටියේ නෑ සේයුන් කුමරිය ගේ අතේ සිඟිත්තෙක් හයියෙන් අඩ අඩ ගුලි වෙනවා කියලවත්....

මකරු දෙන්නා අහසට නැගුණේ මාලිගාව පැත්තෙන් කහපාට ගිනි දලු පරද ගෙන අහසට නැගුණු දුම් වළාකුළු දිහා බලාගෙන හිටිය සේයුන් කුමරිය රතු මකරා ගේ තටු අස්සේ හංගගෙනයි...

සුදු පාට සද්දන්ත මකරාගේ මකර සේනාවේ උදව්වෙන් ඇස්රූස් සටන දිනා ගෙනයි ආවේ.

සේනාව අඩුවෙද්දී පැරදෙන ලකුණු හැමතැනින්ම පේන්න තිබුන නිසා කැස්කස් වල රජතුමා පැනල දිවුවෙ එයාගෙ සේනාව එක්කමයි...

ඒකත් ඔහුගේ වුවමනාවට නොවෙයි මීන් ආදිපාද තුමා ගේ උවමනාවට...ඒ වුණත් ආදිපාදතුමා ට හිතෙන තරම් දෙසින් පැනලා යන්න ලැබුණේ නෑ...එයා කැස්කස් රාජදානියේ රජු පසුපසින් අශ්වයා උඩ වාඩි වෙලා ඉස්සරහට යද්දී පසුපස හැරිලා බැලුවේ බයෙන් බිරාන්ත වෙලා...

ඔහු දුටුවා ඒ ගිණි ගන්න කහපාට ඇස් තමන් දිහාවට යොමු වෙලා තියෙනවා... ඒ සද්දන්ත සුදු මකරා කටින් මීන් ආදිපාදතුමා ව අශ්වයාගේ පිටෙන් ඇදලා ලඟට ඇරගෙන තැනි බිමේ ඈත කෙළවරට විසි කරද්දි කැස්කස් රාජදානියේ රජු ඒ ගැන වද නොවී අසුපිටින් පැන ගියා...

ආදිපාදතුමා බිම වැටිලා ඉද්දි අමාරුවෙන් නැගිටගත්තේ අත් දෙක එකතු කරලා වැද වැටෙන ගමන්...

“මට සමාවෙන්න...සමාව දෙන්න...මාව මරන්න එපා...මාව හිරේ දාන්න...ඒ වුණත් මාව මරන්න එපා...”

ආදිපාදතුමා අත්දෙක එකතු කරගෙන මකරා ඉස්සරහ වැඳ වැටිලා කෑගැහුවා

ඔහුගෙන් සමව කී දෙනෙක් නම් ඉල්ලුවාද..?

ලී වුන් රජු ගේ දෙමව්පියෝ...හන් ජොන්...ඒ කාටවත් අභය දානයක් දෙන්න තරම් මීන් ආදිපාදතුමා කාරුණික වුණේ නෑ ...ඔහුට තිබුණේ බලය ගෙන ලේ පිපාසිත තණ්හාවක්

සේයුන් කුමරිය ගේ  පණ කෙන්ද ඇහැට පෙනෙන හැම වතාවෙම ආදිපාදතුමා ඉරිසියාවෙන් පැලුනා.ලී චුන් කුමරු ව හිරකාරයෙක් කරගෙන බල්ලෙක් වගේ ප්‍රයෝජන ගත්තා...තමන්ගෙම දුවට වහ පොවලා මැරුවා...

එහෙම මනුස්සයෙක් මෙහෙම වැඳ වැටෙද්දී මගේ හිතට අනුකම්පාවක් දැනුනේ නෑ ඔහු හයියෙන් කෑගහගෙන ඉස්සරහට එන ගමන් ගිනි දැල් පිඹිද්දි

ආදිපාද තුමා ගේ සර්වාංගයම රත්තරන් පාට ගිනිදැල්වලින් වැහුණා...

ඒ මුළු දිරච්ච ඇඟම ගිනි දැල්වලින් වැහෙද්දී ආදිපාද තුමා ට කෑගහගෙන වටේ දුවන්න තරම් වෙලාවක් තිබුණෙ නෑ එයාව ඒ ගිනිදැල් වලින් වැහිලා ලෝදිය වගේ දියවෙලා ගියා...

මාලිගාවේ හුඟක් අය එකතුවෙලා  වෙදැදුරු එකතු කරගෙන සොල්දාදුවන්ට බෙහෙත් කලා...

රජතුමා ඒ අතරේ  සේයුන් කුමරිය ඉන්නේ මොන පැත්තද කියලා සෝදිසි කරලා බැලුවා ...

කැලෑ ගානේ හොයලා හොයලා අන්තිමට රජ තැන හොයා ගත්තේ මකරෙක් ගේ කෑ ගැහිල්ලත් එක්ක...ඇත කොහේ හරි ඉඳන් එයාගේ මකර සේනාවේ සේනාධිපති උණ රතුපාට මකරගෙ සද්දෙ ඇහෙද්දි රජ සේනාවත් එක්ක ඒ දිහාවට පිටව ගියා...

රජු අශ්වයාගේ පිටෙන් බැහැලා මකරු දෙන්න දිහාවට දිව්වා...

“ඇය කොහෙද...”

රජු රතුපාට මකරගෙ ඔලුව අත ගාන ගමන් අහද්දි ඔහු දැක්කා මකරා තටු අයිනෙන් පොඩ්ඩක් උස්සනවා...

රජයේ දිහා බලලා ඇතුලට යද්දි දැක්කා පැත්තක හාන්සි වෙලා ඉන්න කුමරියව...ඔහු දුවගෙන ගිහින් කුමරිය ළඟ දණ ගහ ගද්දි  දැක්කෙ  ඇයගේ ස්වරූපය සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇතැයි කියායි...

බඩේ මාංශපේෂි තද වෙලා පිලිවෙලට ඇහිරිලා කලින් තිබුන විදිහමයි..කුමරිය කලින් හිටපු විදියට පෙනෙද්දී ඔහු පුදුම වුණා..

ඔහු පුදුමයෙන් ඇගේ බඩ අත ගාන ගමන් සළුව අස්සෙන් අත යවද්දී ඔහුට දැනුනා සළුව පැත්තකින් ඇයට ගුලිවෙලා ඉන්න සින්දු දෙයක්..

ඔහු අත් දෙක දාලා ඒ සින්දු පුලුන් බෝලෙ වඩා ගනිද්දි සුපුරුදු උණුහුම නැති වුණු නිසා දරුවා හයියෙන් කෑගහල අඬන්න ගත්තේ අත් දෙකෙන් මූනත් පොඩි කර කකුල් දෙක ගසන ගමන්...

රජු දරුවා වඩාගෙන ඉද්දි ඔහුගේ කම්මුල් දිගේ කඳුළු බේරෙනවා ඔහුට දැනුනා ඒ ඇස් හෙමිහිට විවර කර රජු දිහා බලද්දි ඒ පුංචි ඇගේ නිල් පාට රටා මැවිලා ක්ෂණයෙන් අතුරුදහන් වෙලා ගියා...

මකර තටු අස්සෙන් ඇහෙන ඒ අඬන සද්දෙ ඇහෙද්දි රජුගේ සේනාව එක කකුලකින් දණගහලා ආචාර කරා..

මායාවෙන් ඉපදුන දරුවෙක්...අහම්බෙන් ඉපදුන දරුවෙක්...බේදවාචකයන් මැද ඉපදුණු දරුවෙක්...සුබ ආරංචියක්..අනාගත ඔටුන්න හිමි කුමාරයෙක්...

“පුරාවෘත්තයක්..”

ඇස්රූස් කාර්යබහුලයි...නමුත් කැස්කස් රාජධානිය පාළු සුසාන භූමියක් වගේ හැමතැනම ගිනි අරන් විනාස වුනු කැස්කස් රාජදානිය කියලා දෙයක් ආයෙ ඉතුරු වුණේ නෑ...මකර සේනාව ඒ රාජධානිය බිමටම සමතලා කරලා දාලයි තිබුනෙ...

ඇස්රූස් රාජධානිය අලුතෙන් ගොඩ නැඟුවේ ඇස්රූස් වලට නව එළියක් උදාවෙද්දි...රාජධානිය තවත් ශක්තිමත් වුණා... අලුත් කුමාරයා නිසා හැමෝම පෙළපත් නාම අමතක කරා...

ඇස්රූස් රාජදානියේ ඇස්කලස් කියන පෙළපත් නාමය තහනම් කරලා ඇස්රූස් වල හැම කෙනෙක්ම ඇස්කාඩෝ පෙලපත් නාමයෙන් නම් කරා..

“දවසක කුමාරයා ලොකු වේවි ...ඔටුන්නේ අයිතිකාරයා වේවි..ඒ වෙද්දිත් අපි දෙන්නා එකටම ඉදීවි නේද..”

“අනිවාර්යෙන්ම...”

ඒ අතරේ ඔබත් නොදන්නා මමත් නොදන්නා  මායාවෙන් පිරිනු ඇස්රුස් රාජදානියේ කතාව ලස්සනට ගෙතිලා මෙහෙම ලස්සන අවසානය කින්ම නිමා වුණා......

**~නිමි~**

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ඇස්රුස් රාජධානිය

කාවින්දයා සුභාෂණී

ISBN No 978-624-206-996-8

2023/12/8